# වන ආරක්ෂණ සභාව

## වන සංරක්ෂණ වැඩසටහන

## ස්වභාවික හෝ රෝපණය කරන වනභූමි සඳහා

## කළමනාකරණ සහතික ලබාදීමට අදාල උපදේශන අත්පොත

A. හැඳින්වීම

මෙම ලේඛණයේ අඩංගුව ඇත්තේ විද්‍යාත්මක සහතික කිරීමේ ක්‍රමයට Scientific Certification Systems අදාලව භාවිතා කරන ලද අතුරු ප්‍රමිතින්ය. මෙහි සඳහන් කර ඇති ප්‍රමිතීන් ගේ පරාසය ස්වාභාවික මෙන්ම වගාකරන ලද වනාන්තර සඳහා අදාලවේ. ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ වැඩසටහන් සඳහා භාවිතා කිරීම පිණිස වරලත් ප්‍රමිතීන් නිලවශයෙන් හඳුන්වාදීමෙන් අනතුරුව අනාගතයේ දී එම ප්‍රමිතීන්ට අනුකූලව තව දුරටත් ඇගයීම් සිදු කෙරෙනු ඇත. මෙම තත්ත්ව ප්‍රමිතීන් සකස් කර ඇත්තේ වන සංරක්ෂණ අදාල සියලු ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්, ප්‍රමිති සහ උපදෙස් පත්‍රිකා විමර්ශනය කිරීමෙන් අනතුරුවය.

B. ප්‍රමිති භාවිතය

මෙහි සඳහන්ව ඇති ප්‍රමිතීන්ට අදාල අනුකූලත්වය තීරණය කරනු ලබන්නේ වන කළමනාකරණ ඒකකය Forset Management Unit මගින් එක් එක් ප්‍රමිතීන්ට අදාල දර්ශකයන් හා සැසඳීමෙන් සහ එම දර්ශකයන්ට අදාලව ක්‍රියාකර ඇති ආකාරය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුවය. විශේෂයෙන් සඳහන් කර ඇති අවස්ථාවක හැර මෙහි සඳහන් දර්ශක පරාසය SLIMF’s, ඇතුළුව සියලු වන ප්‍රදේශ සඳහා අදාලවේ.

යම් වනාන්තර සහිත ප්‍රදේශයක් ඇගයීම සඳහා මෙම දර්ශක භාවිතා කිරීමේදී එම අවස්ථානුකූලව වඩාත් නිවැරදි ආකාරයෙන් භාවිතා කිරීම පිණිස හෝ පාර්ශවකරුවන්ට මෙම ප්‍රමිතීන් පහසුවෙන් අවබෝධ කර ගත හැකි අයුරින් දර්ශක නිර්වචනය කර සුදුසු ආකාරයෙන් ප්‍රතිව්‍යුහගත කළ හැකිය. එහෙත් එය සිදු කළ හැක්කේ වන කළමනාකරණ සහතික කිරීමේ අධ්‍යක්ෂකතුමා ගේ පූර්ව අනුමැතිය ඇතිව පමණි. ප්‍රතිව්‍යුහගත කිරීම් හෝ ප්‍රමිතීන් භාවිතයට උචිත පරිදි සකස් කර ගැනීම තත්ත්ව සහතිකයට හෝ අනුකූලභාවයට අදාල තීරණ ගැනීම කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ නැත. යම් පැමිණිල්ලක් හෝ අභියාචනයක් ඉදිරිපත් වූ අවස්ථාවකදී ප්‍රමිතීන් සියල්ලම නියත වශයෙන්ම සැලකිල්ලට ගනු ලැබේ.

**නියාමන අංක 1: නෛතික තත්ත්වයන්ට හා වන ආරක්ෂණ සභාවේ Forest Stewardship Council(FSC) නියාමනයන්ට අනුකූලවීම**

.

වන කලමනාකරණ වැඩසටහන යම් රටක අදාල නීතිරීතිවලට මෙන්ම එම රට විසින් අත්සන් තබා ඇති අදාල ගිවිසුම් සහ සම්මුතීන්ට ගරු කරන අතර වන ආරක්ෂණ සභාවට අදාල නියාමනයන් සහ නිර්ණායකයන්ට අනුකූලව කටයුතු කරනු ඇත.

1.1. වන කලමනාකරණ වැඩසටහන මධ්‍යම රජයේ සහ ප්‍රාදේශිය වශයෙන් බලපවත්වන නීතිරීති සහ පරිපාලන අවශ්‍යතාවන්ට ගරු කරනු ලැබේ. **සටහන - මෙම නිර්ණායකයන්ට අනුකූල නොවීම ඉතාමත් *බැරෑරුම් නොසලකා හැරීමක්* ලෙස සලකනු ලබන අතර එය නිසි ආකාරයෙන් නිවැරදි කරන තුරු සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ලැබේ.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.1.1) අදාල අණපනත් සහ නියාමන ආයතන පිලිබඳ යාවත්කාලීන කළ වාර්තාවක් (ආශ්‍රිත ලේඛනයක්) පවත්වාගෙන යාම සහ එය වන පරිපාලකයන්ට ලබාදීම. මේ සඳහා අදාල වැදගත් අණපනත් හා නියාමනයන් ක්ෂේත්‍ර කාර්යාලවලට ලබාදීම.

**1.1.2)** නියාමනයන්ට අනුකූල නොවීමේ අවස්ථාවන් සහ එසේ අනුකූල නොවන ආකාරය හෝ ස්වභාවය අනුව එය පුරුද්දක් ලෙස සිදුවන්නේ ද කොතරම් එය පැතිර ඇත්දැයි යන කරුණු යලි යලිත් පෙන්නුම් කරන්නේ නැති අතර නියාමනයන් හෝ අණපනත් උල්ලංඝනය වූ විට වන පරිපාලකයන් විසින් වහා ක්‍රියාත්මකවී එම තත්ත්වය නිවැරදි කිරීම සහ එම උල්ලංඝනය කිරීම හේතුවෙන් පැන නගින ගැටළු නිරාකරණය කිරීමට පියවර ගත යුතුවේ. **සටහන - මෙම දර්ශකයට අනුකූල නොවීම දැඩි උල්ලංඝනයක් ලෙස සලකන අතර එය සුදුසු ආකාරයෙන් නිවැරදි කරන තුරු සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

1.2. නෛතික වශයෙන් ගෙවිය යුතු අදාල ගාස්තු හිමිකාරත්ව ගාස්තු royalties බදු මුදල් සහ වෙනත් ගාස්තු ආදිය ගෙවීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.2.1) ගෙවීම් දැඩි වශයෙන් පැහැර හැරීමට අදාලව සාක්ෂි නොමැත. ඒ වෙනුවට ගෙවීම් නියමිත කාලයට අනුකූලව ගෙවනු ලැබේ.

1.2.2) සියලු ගෙවීම් පිලිබඳව යාවත්කාලීන කළ වාර්තාවන් විද්‍යාත්මක සහතික කිරීමේ ක්‍රමවේදයට අදාල විගණක නිලධාරියන්ට ලබාදීම.

1.3. මේ සඳහා අත්සන් තබනු ලබන රටවල් විසින් ජාත්‍යන්තර වශයෙන් පිලිගත් අත්සන් තබා සහ බැඳී ඇති සියලු ගිවිසුම් එනම් CITES, ILO, ITTA, සහ ජෛව විවිධත්වය සඳහා වූ පිලිගැනීම් ආදියට ගරු කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.3.1) සියලු වන පරිපාලකයන් විසින් තමන් සේවය කරන රටට හෝ ප්‍රදේශයට අදාල ජාත්‍යන්තර ගිවිසුම් හා බැඳීම් පිලිබඳව දැණුවත්වීම.

1.3.2) වන පරිපාලකයන් එවැනි ජාත්‍යන්තර බැඳීම් සහ ගිවිසුම් කෙරෙහි සංවේදී වන අතර එහි ඇති කරුණුවලට ගරු කිරීම සහ තමන්ට අදාල වන ප්‍රදේශයේ ඇති තීව්‍රතාවය intensity සහ පරිමානයට ප්‍රමාණවත් අයුරින් කටයුතු කිරීමට පියවර ගැනීම.

1.4. සහතික කිරීමේ ක්‍රියා පටිපාටියේදී අණපනත්, නියාමන සහ විද්‍යාත්මක සහතික කිරීමේ මූලධර්මයන් එකිනෙක ගැටෙන ආකාරය එක් එක් අවස්ථාවෙන් අවස්ථාවට සහතික කිරීමේ කාර්යයේ නියැලෙන පාර්ශවයන් සහ බලපෑම් ඇතිවන පාර්ශවයන් විසින් විමසා බැලිය යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.4.1) වන පරිපාලකයන් විසින් විද්‍යාත්මක සහතික කිරීමේ ක්‍රමයේ නියැලෙන විගණක නිලධාරීන්ට අණපනත්, නියාමනයන් සහ වන සංරක්ෂණ සහතික කිරීමේ මූලධර්මයන් එකිනෙක හා ගැටෙන අවස්ථාවන් පිළිබඳව පූර්ව දැනුම්දීමක් සිදු කළ යුතුය.

1.4.2) විද්‍යාත්මක සහතික කිරීමේ කාර්යයේ සහ/හෝ වන ආරක්ෂණ සභාව ඉල්ලීමක් සිදුකළ අවස්ථාවන්හි එවැනි ගැටළු සහගත තත්ත්වයන් විසදාලීමට වන පරිපාලකයන් සහභාගිවීමට ඉදිරිපත්වීම.

1.5. කලමනාකරණයට ලක්ව ඇති වන භූමිය අනවසර වන විනාශයන්, ජනාවාසයන් සහ වෙනත් අනවසර කටයුතුවලින් ආරක්ෂා කර ගත යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.5.1) අනවසර වන විනාශයන්, ජනාවාස ඇතිවීම් සහ වෙනත් අනවසර කටයුතු සිදුවීමෙන් ආරක්ෂා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තීන් වන කලමනාකරණ සැලසුමට ඇතුලත්වීම.

1.5.2) වන පරිපාලකවරුන් විසින් තමන්ට අයත් වනභූමිය තුළ නිරන්තරයෙන්ම විමර්ශන කටයුතු සිදු කිරීම මගින් අනවසර ක්‍රියාවන් වහා සොයා ගැනීමට හැකිවීම සහ පාලනය කිරීමට හැකිවීම.

**1.6.** වන පරිපාලකවරුන් විසින් වන ආරක්ෂණ සභාවේ ප්‍රතිපත්තීන් සහ නියාමනයන්ට දිගු කාලීන වශයෙන් කැපවීම. සටහන - **මෙම තීරණයකට අනුකූල නොවීම බැරෑරුම් අතපසුවීමක් ලෙස සලකන අතර එම තත්ත්වය සුදුසු ආකාරයෙන් නිවැරදි කරන තුරු සහතිකය ලබාදීමෙන් වැලකීම**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

1.6.1) වන ආරක්ෂණ සභාවේ ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට ඇති කැපවීම පිලිබඳව වන කලමනාකරණ සැලසුමේ හෝ පොදු ජනතාවට ලබා ගත හැකි වෙනත් සුදුසු ලේඛනයක ප්‍රකාශයක් ලෙස සඳහන් කිරීම

1.6.2) වන ආරක්ෂණ සභාවේ ප්‍රතිපත්තීන් සහ නියාමනයන් පිලිබඳ ලිඛිත පිටපත් පරිපාලකවරුන්ට සහ ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා ගැනීමට හැකිවීම; වන පරිපාලකවරුන් මෙම ප්‍රතිපත්තීන් සහ නියාමනයන් පිලිබඳව නිසි ආකාරයෙන් දැනුවත්වීම

1.6.3) සහතික කිරීමට යටත්වන වන භූමි ප්‍රදේශයේ සම්පූර්ණ අයිතිය විද්‍යාත්මක සහතිකය ඉල්ලා සිටින පාර්ශවය සතු නොවේ නම් සහතික කිරීමට යටත්වන අයිතිය නොමැති භූමි ප්‍රමාණය ද අදාල ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට මෙන්ම වන ආරක්ෂණ සභාවේ ප්‍රතිපත්තීන්ට සාමාන්‍යයෙන් අනුකූලවීම

**නියාමන අංක 2: භුක්තිය සහ භාවිතා කිරීමේ අයිතිවාසිකම් සහ වගකීම්**

දිගු කාලීන භුක්තිය සහ භූමිය සහ වන සම්පත් සඳහා වන අයිතිය පැහැදිලි ලෙස නිර්වචනය කිරීම, ලේඛනගත කිරීම සහ නීතිමය වශයෙන් තහවුරු කිරීම

2.1. දිගු කාලීන ලෙස වන භූමිය භුක්තිවිඳීමට අයිතිවාසිකම් ඇතිබව පැහැදිලි සාක්ෂි සහිතව තහවුරු කිරීම. (ඉඩම් ඔප්පු, සම්ප්‍රදායානුකූල අයිතිය හෝ බදු ගිවිසුම්) සටහන - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

2.1.1) සහතික කිරීමේ ක්‍රියාවලියට අදාල වන භූමිය සඳහා නෛතික අයිතිවාසිකම් ලිඛිත ලිපිලේඛන මගින් අව්‍යාජ ලෙස තහවුරු කිරීම

2.1.2) සහතික කිරීමට යටත්වන වන භූමි ප්‍රමාණයක් භාවිතය සඳහා යහපත් චේතනාවෙන් යුක්තව නිකුත් කරන ලද නීතිමය ලියවිලි ඇත.

*භාවිතයට ඇති නීතිමය අයිතිය පහත ආකාරයෙන් විය හැකිය:*
*- සුළු ශාස්තුවකට යටත්ව අයිතිය පැවරීම fee-simple ownership*
*- දිගු කාලීනව හෝ නැවතකාලය දිගුකල හැකි ආකාරයෙන් බදු අයිතිය ලබාදීම*
*- දිගු කාලීනව හෝ නැවතකාලය දිගුකල හැකි ආකාරයෙන් කලමනාකාරීත්වය පැවරීම*
*- දිගු කාලීනව හෝ නැවතකාලය දිගුකල හැකි ආකාරයෙන් කලමනාකාරීත්වය අයිතිය සහ වගකීම වන පරිපාලකයන්ට පැවරීමේ අනෙකුත් යාන්ත්‍රණයන්*

2.2. නීතිමය වශයෙන් හෝ සම්ප්‍රදායානුකූලව වන භූමියකට හා එහි සම්පත් භුක්තිවිඳීමට ඇති අයිතිය ඔවුන් විසින් අය කිරීමකින් තොරව යම් ආයතනකට පවරා දී ඒ පිලිබඳව අදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අවස්ථාවන් හැරුණුවිට ප්‍රජාවේ අයිතිවාසිකම් හා සම්පත් භුක්ති විඳීමට ඇති අයිතියට යටත්ව පාලනය කිරීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

2.2.1) ප්‍රජාව සහ/හෝ නෛතික හෝ සම්ප්‍රදායානුකූලව භුක්ති විඳීමට අයිතිය ඇති නිශ්චිත වන භූමියක් වෙනත් පාර්ශවකරුවන් පැවරීම. මෙම අයිතිවාසිකම්වල ස්වභාවය පැහැදිලි කර ලේඛන ගත කර තිබීම

*නෛතික හෝ චාරිත්‍රානුකූලව භුක්තිවිඳීමට ඇති අයිතිය හෝ භාවිතා කිරීමට අයිතියට උදාහරණ:*
*-පොදු ගමන් මාර්ග*
*-දැව නොවන වෙනත් නිෂ්පාදන රැස් කිරීම*
*-කඳුනැගීම මසුන් ඇල්ලීම දඩයම් කිරීම හෝ වෙනත් විනෝදාත්මක කටයුතු*
*-ඉන්ධන සඳහා දර රැස්කිරීම*
*-සංස්කෘතිමය වටිනාකමක් ඇති ස්ථාන කරා යාම*

2.2.2) වන පරිපාලකවරුන් විසින් වන භූමි ප්‍රදේශය සම්ප්‍රදායානුකූලව හෝ නෛතික වශයෙන් භාවිතා කිරීමට අයිතිය ඇති පාර්ශවත් සමග ධනාත්මක/සහයෝගිතාවයකින් යුක්තව කටයුතු කිරීමට හැකි අයුරින් සම්බන්ධතා පවත්වා ගෙන යාම.

2.2.3) නෛතික වශයෙන් හෝ සම්ප්‍රදායානුකූලව භුක්ති විඳීමට ඇති අයිතිය යම් ප්‍රජා කොටසක් විසින් අන් පාර්ශවයකට පැවරීම නිසි ආකාරයෙන් ලේඛන ගත කිරීම සහ එහිදී මෙම පැවරීම නිදහස්ව (යම් බලපෑමකට යටත් නොවී) සහ කැමැත්ත ඇතිව සිදු කළ බවට සාක්ෂි දැරීම.

2.3. භුක්ති විඳීමට ඇති අයිතිය සහ භාවිතයට ඇති අයිතිය පිළිබඳ පැණ නගින ගැටුම් හා මතභේද විසඳීමට නිසි ආකාරයේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. එවැනි නොවිසිඳී ඇති ගැටුම් හා මතභේද ආදිය සහතික කිරීමේ ක්‍රියාවලියේ දී පැහැදිලි ලෙස හා විවෘත ආකාරයෙන් සැලකිල්ලට ගනු ලැබේ. මෙම ගැටළු හෝ මතභේද පුළුල් හා සැලකිය යුතු පාර්ශව කීපයක් සම්බන්ධව ඇති අවස්ථාවන්හිදී සාමාන්‍යයෙන් එම ක්‍රියාවලිය සහතික කිරීම ප්‍රතික්ෂේප විය හැකිය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

2.3.1) විද්‍යාත්මක සහතික කිරීමේ කාර්යයේ නියැලෙන විගණන නිලධාරින්ට එහි ස්වභාවය සහ ප්‍රමාණය දැන ගැනීමට හැකි අයුරින් භුක්ති විඳීම් ඉල්ලා සිටි අවස්ථාවන් හෝ භාවිතයට ඇති අයිතිය ඉල්ලා සිටි අවස්ථාවන් හා අතීතයේ දී පැණ නැගී තිබූ ගැටළු හෝ මත භේද ආදිය පිළිබඳව ප්‍රමාණවත් අයුරින් වාර්තා හා ලේඛන නඩත්තු කිරීම

2.3.2) වන භූමිය භුක්ති විඳීමට හෝ භාවිතා කිරීමට ඇති අයිතිය පිළිබඳ ගැටළු හෝ මතභේද පැණ නැගී ඇති අවස්ථාවන්හිදී එය විසඳීමට නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් භාවිතා කර ඇති බව වන පරිපාලකයන් විසින් විගණක නිලධාරින්ට පෙන්වාදීමට ඇති හැකියාව.

2.3.3) භුක්තිය හෝ භාවිතයට අයිතිවාසිකම් ඉල්ලා පැණ නැගී නොවිසඳී ඇති ගැටළු හා මතභේද වන කළමනාකරිත්වයට ඉතා සුළු අයුරින් බලපෑම් ඇති කිරීම

**නියාමන අංක 3: පාරම්පරිකව වාසය කරන පිරිස ගේ අයිතිවාසිකම්**

පාරම්පරික ජන කණ්ඩායම්වලට වන භූමිය හා එහි සම්පත් අත්පත් කර ගැනීමට භාවිතා කිරීමට සහ කළමනාකරණය කිරීමට ඇති නීතිමය සහ සම්ප්‍රදායානුකූල අයිතිය මෙහිදී හඳුනාගන්නා අතර එයට නිසි ගෞරවයක් ද හිමි කර දෙනු ලබයි.

**3.1.** තමන් සතු වන භූමිය අන් පාර්ශවයකට නිදහස්ව සහ අනුමැතිය ඇතිව පවරා ඇති අවස්ථාවක හැරුණුවිට පාරම්පරික ජන කණ්ඩායම් විසින් තමන් ගේ අයිතිවාසිකම් මත වන භූමිය කළමනාකරණය කළ යුතුවේ සටහන - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

3.1.1) සහතික කිරීමට අදාල වන භූමි සීමාව තුළ පාරම්පරික ජන කණ්ඩායම්වලට අදාලව යම් ගැටළු (උදා- ඉඩම් භුක්තිය ඉල්ලා සිටීම) දැනට පැණ නැගී ඇත්දැයි යන්න වන පරිපාලකයන් විසින් තීරණය කළ යුතුවේ.

3.1.2) හඳුනාගන්නා ලද වන භූමිය සම්පූර්ණයෙන්ම හෝ යම් කොටසක් පාරම්පරික ජන කණ්ඩායමකට අයත් හෝ ඔවුන් විසින් පාලනය කරනු ලබන භූමියක් නම් එම වන භූමි කොටසේ පාලනය 1) පාරම්පරික ජන කණ්ඩායම යටතේ හෝ 11) පාරම්පරික ජන කණ්ඩායම නිදහස්ව සහ ස්ව කැමැත්තෙන් අන් පාර්ශවයකට එම කාර්යය පවරා ඇති බවත් එම පැවරීම නිසි ආකාරයෙන් ජන කණ්ඩායමේ සුදුසු නියෝජිතයන් ගේ අනුමැතිය සහිතව ලේඛන ගත කර තිබීම.

3.1.3) පාරම්පරික ජන කණ්ඩායම් සතු අයිතිය සහ භාවිතය පිළිබඳ ගැටළු පැණ නැගී ඇති අවස්ථාවන්හිදී එම දුක් ගැනිවිලි විසඳීමට පියවර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සහ එම ක්‍රමවේදය වන පරිපාලකයන්/අයිතිකරුවන් විසින් ක්‍රියාකාරී අයුරින් භාවිතා කිරීම.

3.2. වන පරිපාලකවරුන් විසින් ඍජුව හෝ වක්‍රාකාරයෙන් පාරම්පරික ජන කණ්ඩායම් සතුව ඇති සම්පත් හෝ භුක්තියට ඇති අයිතිය පැහැර ගැනීම හෝ එයට බලපෑම් ඇති නොකිරීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

3.2.1) වන පරිපාලකවරුන් විසින් සිය ප්‍රතිපත්ති සහ ක්‍රියාවන් තුළින් පාරම්පරික ජන කණ්ඩායම් සතු සම්පත් සහ භුක්තියට ඇති අයිතිය පිළිබඳ සංවේදී වීම.

3.2.2) පාරම්පරික සම්පත් සහ භුක්තියට ඇති අයිතිය පාරම්පරික ජන කණ්ඩායම් සතුවූ  වන භූමිය කළමනාකරණය සැලසුම් කිරිමේදී පර්යේෂණ කිරීමේ දී සහ ඒ ප්‍රදේශවල පසුවිපරම් කටයුතු සිදු කිරීමේ දී මෙම ජනකණ්ඩායම්වලට සහභාගීවීමට අවකාශ සැලසිය යුතුවේ.

3.2.3) බලපෑම් ඇතිවිය හැකි පාරම්පරික ජන කණ්ඩායම්වල අදහස් හා සැලකිල්ලට ගත යුතු කරුණු ආදිය විමසා බැලීමට වන පරිපාලකවරුන් විසින් එම පාර්ශවයන් සමග නිසි ආකාරයෙන් සාකච්ඡාවන්ට එළඹීම. එවැනි සාකච්ඡාවන් ගේ ප්‍රතිඵල හා එම පාර්ශවයන් ගෙන් ලැබුණු අදහස් හා සැලකිල්ලට ගත යුතු කරුණු ආදිය කෙරෙහි සාධාරණ අයුරින් අවධානය යොමු කිරීමට ගත් පියවර ආදිය ලේඛන ගත කිරීම

3.3. සම්ප්‍රදායික ජන කණ්ඩායම්වලට සංස්කෘතික, පාරිසරික, ආර්ථික හෝ ආගමික වශයෙන් වැදගත්වන ස්ථාන ඔවුන් ගේ සහයෝගය ද සහිතව පැහැදිලි ලෙස හඳුනා ගත යුතු අතර වන පරිපාලකවරුන් විසින් ඒවා ආරක්ෂා කිරීමට පියවර ගැනීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

3.3.1) සම්ප්‍රදායික ජන කණ්ඩායම්වලට සංස්කෘතික, පාරිසරික, ආර්ථික හෝ ආගමික වශයෙන් වැදගත්වන ස්ථාන වලට බලපෑම් ඇතිවිය හැකි කළමනාකරණ ක්‍රියාවලියන් සිදු කරන අවස්ථාවන්හිදී ඒවා ආරක්ෂා කිරීමේ මූලධර්ම අනුගමනය කළ යුතුය.

එවැනි ස්ථානවලට උදාහරණ:
- සුසාන භූමි හෝ ගම්මාන
-දඩයම් කිරීමට මසුන් මැරීමට හෝ උගුල් ඇටවීමට භාවිතා කළ ස්ථාන
-සංස්කෘතික වශයෙන් වැදගත් වන යම් යම් දේ රැස්කිරීමට හෝ පවත්වාගෙන යාම පිණිස යොදා ගන්නා ස්ථාන

3.3.2) සංස්කෘතික හෝ ආගමික වශයෙන් වැදගත්වන ස්ථානයන් හඳුනා ගැනීමට හා ඒවා ආරක්ෂා කිරීමට වන පරිපාලකවරුන් විසින් පිලිගත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. එවැනි ස්ථාන හඳුනාගැනීමට සහ ආරක්ෂා කිරීමට අදාල ක්‍රියාවලිය ලේඛන ගත කළ යුතුය. මෙම ස්ථාන හඳුනා ගැනීමේ සහ ආරක්ෂා කිරීම පිලිබඳ ප්‍රතිපත්තින් ලිඛිතව කළමනාකරණ සැලසුමට ඇතුලත් කළ යුතුය.

3.3.3) සම්ප්‍රදායික ජන කණ්ඩායම්වලට වැදගත්වන ස්ථාන ආරක්ෂා කර ගැනීම පිණිස අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිලිබඳව නිසි ආකාරයෙන් පුහුණු කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් සේවයේ යෙදවීම.

3.3.4) විශේෂ වැදගත්කමක් ඇති ස්ථාන සලකුණු කරන ලද රහසිගත සිතියම් යාවත්කාලීන කරමින් නඩත්තු කළ යුතු අතර ඒවා වන පරිපාලකවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් භාවිතා කිරීම.

3.3.5) කළමනාකරණ ක්‍රියාවලියට ලක්ව ඇති වන භූමිය සතුවූ සම්ප්‍රදායික ජන කණ්ඩායම්වලට සංස්කෘතික, ජෛවීය, ආර්ථික හෝ ආගමික වශයෙන් වැදගත් වන ස්ථාන හඳුනා ගැනීමේදී හා ආරක්ෂා කිරීමේ දී එම ජන කණ්ඩායම්වලට සහභාගිවීමට අවස්ථාවන් ලබාදීම

3.4. වන භූමියේ ශාක සහ සත්ත්ව විශේෂ හෝ කළමනාකරණ පද්ධතීන් ආරක්ෂා කිරීමේ දී සම්ප්‍රදායික ජන කණ්ඩායම් සතු දැණුම භාවිතා කරන අවස්ථාවන්හිදී ඔවුන්ට ප්‍රමාණවත් අයුරින් ප්‍රතිලාභ අත්පත් කර දිය යුතුය. වන කලමනාකරණ ක්‍රියාවලිය ඇරඹීමට පෙර සම්ප්‍රදායික ජන කණ්ඩායම් සමග කරුණු හා ප්‍රතිලාභ පිළිබඳව නිදහස්ව බලපෑමකින් තොරව තිල වශයෙන් එකගවිය යුතුය.

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

3.4.1) සම්ප්‍රදායික දැණුම වානිජමය අයුරින් උපයෝගී කර ගන්නා අවස්ථාවන්හිදී වන පරිපාලකවරුන් විසින් සුදුසු යාන්ත්‍රණයන් භාවිතා කරමින් ඔවුන්ට නිසි ප්‍රතිලාභ ලබාදීමට පියවර ගත යුතුයි.

3.4.2) සම්ප්‍රදායික ජන කණ්ඩායම් සතු බුද්ධිමය දේපල සහ වන ආශ්‍රිත නිෂ්පාදන වානිජමය අයුරින් භාවිතා කරන අවස්ථාවන්හිදී එයට නිසි අයුරින් ප්‍රතිලාභ පෞද්ගලික මෙන්ම කණ්ඩායම් වශයෙන් ලබාදීමට ලිඛිතව එකගවීම සහ එම එකගතාවන්ට බලපෑමකින් තොරව නිදහස්ව එළඹීම. මෙම එකගතාවන්ට එළඹිය යුත්තේ වානිජමය ලෙස එම කාර්යයන් ඇරඹීමට පෙරය

**නියාමන අංක 4: ප්‍රජා සම්බන්ධතා සහ සේවකයන් ගේ අයිතිවාසිකම්**

වන කලමනාකරණ ක්‍රියාවලිය මගින් වන සංරක්ෂණ සහ කලමනාකරණ කටයුතුවල නියැලෙන සේවකයන් ගේ සහ ප්‍රජාවගේ ආර්ථික සහ සමාජීය සුභසාධනය පවත්වාගෙන යාම හෝ දිගු කාලීන ලෙස පුළුල් කිරිමට අවකාශ සැලසීම

4.1. කලමනාකරණ ක්‍රියාවලියට යටත්වන භූමිය තුල හෝ ඒ ආසන්නයේ වෙසෙන ප්‍රජාවට රැකියා සහ පුහුණු අවස්ථාවන් ලබාදීම හා අන් සේවා සැපයීමට අවකාශ සලසාදීම.

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

4.1.1) රැකියා ලබාදීමේ දී සහ කොන්ත්‍රාත්තු පැවරීමේ දී ප්‍රදේශයේ වෙසෙන ජනතාව අතරින් සුදුසුකම් ඇති පිරිසට වැඩි අවස්ථාවන් ලබාදීම. වන කලමනාකරණ ක්‍රියාවලිය ප්‍රාදේශීය ජනතාව සේවයේ යෙදවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරිම

*උදාහරණ:*
*-රැකියාවන් සහ කොන්ත්‍රාත් ලබාදීමේදී ප්‍රාදේශීය ජනතාවට පළමුවෙන් අවස්ථාව ලබාදීම හා ඉන් පසු එය බාහිර පාර්ශවයන්හට විවෘත කිරීම*

4.1.2) ප්‍රදේශයේ වෙසෙන ජනතාව ගේ හැකියාවන් සහ සුදුසුකම් වර්ධනය කිරීම පිණිස සෘජුව දායකවන පුහුණු වැඩසටහන් සකස් කිරීමට වන පරිපාලකවරුන් දායකවීම.

4.1.3) පිරිවැය සැලකිල්ලට ගනිමින් වන පරිපාලකවරුන් විසින් උපකරණ සහ වෙනත් සේවා මිලයට ගැනීමේදී ප්‍රාදේශීය වෙළඳ ආයතන සහ විකුණුම්කරුවන්ට මූලිකත්වය ලබාදීම

*උදාහරණ:*
*-ලීදඬු ආදිය බාහිර පාර්ශවයන් වෙත විකිණීමට පෙර ප්‍රාදේශිය ආයතන වෙත ලබාදීමට පියවර ගැනීම*
*-ප්‍රදේශයේ ඇති බැංකු රක්ෂණ ආයතන ආදියේ සේවය ලබා ගැනීම.*

4.2. වන කලමනාකාරිත්වය සේවකයන් ගේ සහ ඔවුන් ගේ පවුල්වල සෞඛ්‍ය සහ ආරක්ෂාවට අදාල සියලු නීතිරීති/රෙගුලාසිවලට අනුගතවීමට පියවර ගැනීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

4.2.1) වන කලමනාකාරිත්ව ක්‍රියාකාරකම් ආදියේදී සේවකයන් ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කර ඇති බව පෙන්නුම් කිරීම. ක්‍රියාවලියේ පරාසය අනුව ඊට අදාලව සේවක ආරක්ෂාව සැලසීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

රැකියා ස්ථානයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සැලසීමට ලිඛිත උපදෙස් මාලාවන් සහ ප්‍රතිපත්තීන් සකස් කිරීම

4.2.2)

*උදාහරණ - රබර් පීට් සකස් කිරීමේ ක්‍රියාවලියේදී එක් එක් පියවරට අදාලව ලිඛිත උපදෙස් මාලාවක් සකස් කිරිම එනම් රබර් කිරි කැපීමේ සිට එය පදම් කිරීමේ සහ නිෂ්පාදනය දක්වා වූ පියවර මෙහිදී ආවරණය කිරීම.*

4.2.3) සියලු සේවකයන් සඳහා සුදුසු ආරක්ෂක උපකරණ ලබාදීමට පියවර ගැනීම

4.2.4) සියලු උපකරණ නියමිත කාලයකට වරක් පරීක්ෂා කිරීම සහ එය ආරක්ෂිත අයුරින් ක්‍රියාත්මක වන්නේදැයි තහවුරු කර ගැනීම

4.2.5) සෞඛ්‍යයට සහ ආරක්ෂාවට අදාලව යාවත්කාලීන කළ නීතිරීති සහ තොරතුරු වන පරිපාලකවරුන් විසින් නඩත්තු කිරීම සහ ඒවා සේවකයන්ට ලබාදීමට පියවර ගැනීම

4.2.6) වන පරිපාලකවරුන් විසින් ආරක්ෂාව පිළිබඳ යාවත්කාලීන කළ වාර්තාවන් පවත්වාගෙන යා යුතුය. එමගින් කර්මාන්තයට අදාල උසස් මට්ටමේ ප්‍රමිතීන් පිළිබඳ ආදර්ශයන් ලබා දෙනු ඇත.

**4.3.** සේවකයන්ට සංවිධානයවීමට සහ ස්වේච්ඡාවෙන් සිය ස්වාමි පාර්ශවයන් සමග සාකච්ඡා කිරීමට ඇති අයිතිවාසිකම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 87 සහ 98 වගන්ති වලින් දක්වා ඇත. එම අයිතිය තහවුරු කිරීම. - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

4.3.1) සේවකයන්ට සංවිධානයවීමට හෝ වෘත්තීය සමිතීන්ට බැඳීම සේවක අයිතින් වෙනුවෙන් සාමූහික ගිවිසුම්වලට එළඹීමට සේවකයන්ට ඇති අයිතියට ගරු කිරීම

වන පරිපාලකවරුන් විසින් තමන් ගේ ක්‍රියාවන් හා ප්‍රතිපත්ති මගින් තහවුරු කිරීම

4.3.2) සේවකයන් සහ/හෝ ඔවුන් ගේ ආයතන මගින් ඉදිරිපත් කරන ගැටළු සහ දුක් ගැනවිලි ආදිය සාධාරණ සහ එහි අභිප්‍රායන් වෙනුවෙන් සොයා බැලීම

4.3.3) ගැටුම් සමතකරණය සඳහා ලිඛිතව ක්‍රියාවලියක් සකස් කර තිබීම

4.4. සමාජ බලපෑම් ඇගයීමේදී ලැබූ ප්‍රතිඵල කලමනාකරණ සැලසුම සහ ක්‍රියාවලිය සඳහා ඇතුලත් කර ගත යුතුවේ. කලමනාකරණ ක්‍රියාවලිය හේතුවෙන් ඍජු බලපෑම් ඇතිවන පුද්ගලයන් සහ ප්‍රජා කණ්ඩායම් සමග සාකච්ඡාවන් පැවැත්විය යුතුය (ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයම ඇතුලත්ව)

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

4.4.1) සමාජ බලපෑම් ඇගයීමෙන් ලැබෙන ප්‍රතිඵලවලට අනුකූලව කලමනාකරණ ක්‍රියාවලින් සහ ප්‍රතිපත්තින් සුදුසු ආකාරයෙන් වෙනස් කිරීම

4.4.2) ප්‍රාදේශීය ජනතාව අතර සිටින පාර්ශවකරුවන් සේවකයන් සහ ආසන්නයේ වෙසෙන ජනතාව සමග වන පරිපාලකවරුන් නිරන්තරව සන්නිවේදනයේ නියැලිය යුතුය. එමගින් කලමනාකරණ ප්‍රතිපත්තින් සහ ක්‍රියාවලියන් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන්ට සහ සැලකිල්ලට ගන්නා කරුණු කෙරෙහි කෙතරම් සංවේදීද යන්න ප්‍රායෝගික වශයෙන් අවබෝධ කර ගැනීම

4.4.3) කලාපය සැලකිල්ලට ගැනීමේ දී කලාපය තුළ වන කලමනාකරණ ක්‍රියාවලිය ***හොඳ අසල්වැසියෙක්*** යනුවෙන් හැඳින්වීම.

4.4.4) කලමනාකරණ ක්‍රියාවලිය සඳහා හඳුනාගන්නා ලද වන භූමි ප්‍රදේශයතුළ සැලසුම් කර ඇති ක්‍රියාවලියන් පිලිබඳව වන පරිපාලකවරුන් විසින් අසල්වැසි ජනතාවට සහ ප්‍රජා සාමාජිකයන් දැනුවත් කිරීමට පියවර ගැනීම

:

වන කලමනාකරණ ඒකකයේ රුස්වීම් සඳහා SLIMF අවශ්‍යතාවන්ට අනුව පහත දැක්වෙන දර්ශක අදාලවේ. මෙම දර්ශකයන් SLIMF නොවන ක්‍රියාවන් තක්සේරු කිරීම සඳහා භාවිතා නොකරනු ඇත.

4.4.5) ප්‍රාදේශීය ජනතාව අතර සිටින පාර්ශවකරුවන් සේවකයන් සහ ආසන්නයේ වෙසෙන ජනතාව සමග වන පරිපාලකවරුන් නිරන්තරව සන්නිවේදනයේ නියැලිය යුතුය. එමගින් කලමනාකරණ ප්‍රතිපත්තින් සහ ක්‍රියාවලියන් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන්ට සහ සැලකිල්ලට ගන්නා කරුණු කෙරෙහි කෙතරම් සංවේදීද යන්න ප්‍රායෝගික වශයෙන් අවබෝධ කර ගැනීම

4.4.6) කලාපය සැලකිල්ලට ගැනීමේ දී කලාපය තුළ වන කලමනාකරණ ක්‍රියාවලිය ***හොඳ අසල්වැසියෙක්*** යනුවෙන් හැඳින්වීම.

4.5. ප්‍රදේශයේ ජනතාව ගේ දේපල සම්පත් හෝ ජීවිකාවට ඇති නීතිමය හෝ සම්ප්‍රදායක අයිතියට බලපෑම් ඇතිවන අවස්ථාවන්හිදී හෝ එය අහිමිවන අවස්ථාවන්හිදී පැන නගින ගැටළු හෝ දුක් ගැනවිලි ආදිය විසඳාලීමට හෝ විමසා බැලීමට අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට සාධාරණ වන්දි ලබාදිමට සුදුසු යාන්ත්‍රණයන් ස්ථාපිත කිරිම එවැනි හානි සහ බලපෑම් ඇති නොවීමට සැමවිටම පියවර ගැනීම

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

4.5.1) එවැනි ගැටළු සහගත තත්ත්වයන් උද්ගත විය හැකි ස්ථාන නියත ක්‍රමවේදයන් භවිතා කරමින් හඳුනා ගැනීම. මෙහිදී අදාල වන භූමි ප්‍රදේශයේ සිදුකරන වන කලමනාකරණ කටයුතු හේතුවෙන් බලපෑම් ඇතිවිය හැකි නෛතික හෝ සම්ප්‍රදායික අයිතිය හඳුනාගැනීම හා එයට ගරු කිරිමටත් එවැනි කටයුතු නෛතික රාමුවක සිදු කිරිමටත් පියවර ගෙන තිබීම.

4.5.2) වන පරිපාලකවරුන් විසින් සිය ක්‍රියාවන් සහ ප්‍රතිපත්තීන් තුලින් ප්‍රදේශයේ ජනතාව ගේ දේපල සම්පත් හා/හෝ ජීවිකාවන්ට ඇතිවිය හැකි හානිදායක බලපෑම් වලකාලීමට පියවර ගැනීම

4.5.3) වන කලමනාකරණ ක්‍රියාවන් හේතුවෙන් ප්‍රජාව සතු දේපල සම්පත් හෝ ජීවිකාවට හානි පැමිණිම හා/හෝ ඔවුන් ගේ සම්ප්‍රදායික හෝ නීතිමය අයිතියට බලපෑම් ඇතිවන විට එවැනි දුක්ගැනිවිලි විමසා බැලීමටත් ඔවුන්ට සාධාරණ වන්දි ලබාදීමටත් සුදුසු ක්‍රියාවලියක් සකස් කිරිම.

**නියාමන අංක5: වන භූමියෙන් ලැබෙන ප්‍රතිලාභ**

ආර්ථික ශක්‍යතාව සහ පුළුල් පරාසයක් තුල පාරිසරික සහ සමාජීය ප්‍රතිලාභ ලබා ගැනීමට වන භූමියෙන් ලැබෙන විවිධ නිෂ්පාදන සහ සේවාවන් කාර්යක්ෂම ලෙස භාවිතා කිරිමට වන කලමනාකාරිත්ව ක්‍රියාවලිය විසින් උද්යෝගය හා උනන්දුව වර්ධනය කිරිම

5.1. වන කලමනාකරිත්වය විසින් පූර්ණ පාරිසරික සමාජීය සහ නිෂ්පාදනය කිරිමේ වියදම් ද සැලකිල්ලට ගනිමින් සහ වන භූමියේ ජීවී ඵලදායිතාව නඩත්තුවීමට අවශ්‍ය ආයෝජනයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් ආර්ථික ශක්‍යතාව අත් කර ගැනීමට පියවර ගත යුතුය.

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

5.1.1) වන කලමනාකරණ ක්‍රියාවලියේ මූල්‍ය සම්පත් සැලකිල්ලට ගැනීමේ දී පාරිසරික සහ සමාජීය පිරිවැය ද ඇතුළුව වන කලමනාකරණයේ සම්පූර්ණ පිරිවැය සැලකිල්ලට ගැනීම සහ ප්‍රමාණවත් අයුරින් ආවරණය කර තිබීම.

5.1.2) අදාල වන භූමිය තුල ඵලදායි ධාරිතාව ජීවි අඛණ්ඩතාවය සහ සමාජ-ආර්ථික රටාව පවත්වා ගෙනයාමට හෝ යථා තත්ත්වයට පත් කළ හැකි පරිදි පරිදි ප්‍රමාණවත් ප්‍රාග්ධන යන්ත්‍රසූත්‍ර හා මානව සම්පත් ආයෝජනය කිරිම

5.1.3) කෙටි කාලීන සහ මධ්‍ය කාලීන වෙළඳපොල තත්ත්වයන් සහ පිරිවැය අනුව වානිජ (ආදායම් උත්පාදනයවන) ක්‍රියාවලියන් මූල්‍යමය ශක්‍යතාවයකින් යුක්තවීම.

5.2. වන භූමියේ ඇති විවිධවයෙන් යුත් නිෂ්පාදනයන් වඩාත් ප්‍රයෝජනවත් අයුරින් භාවිතා කිරීමට වන කලමනාකරණ හා වෙළඳපොල ක්‍රියාවලිය තුලින් උනන්දුව ඇති කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

5.2.1) වන ආශ්‍රිත වානිජ මට්ටමේ නිෂ්පාදන ඉහල මිලකට මෙන්ම ඉතාමත් සුදුසු ආකාරයෙන් භාවිතා කිරීමට හැකිවන පරිදි අලෙවි කිරීමට කලමනාකරණ සහ වෙළඳපොල ප්‍රතිපත්තීන් මෙන්ම ක්ෂේත්‍ර මට්ටමේ තීරණයන්ද මගින් ද ක්‍රමානුකූලව තහවුරු කර ගත යුතුවේ.

*උදාහරණ:*
- *සුලභව ඇති එහෙත් භාවිතායෙන් අඩු විශේෂ සඳහා නව නිෂ්පාදන කිරීමට ඇති හැකියාව සොයා බැලීම*
- *නව වෙළඳපොළවල්වලට පිවිසීමට ඇති හැකියාව සොයා බැලීම*

5.2.2) වන ප්‍රදේශවලින් සපයා ගන්නා නිෂ්පාදන විවිධත්වයකින් යුක්තව වෙළඳපොලට නිකුත් කිරීමට ඇති හැකියාව සොයා බැලීම

5.2.3) වන කලමනාකාරිත්වය විසින් දැව හා රබර් ආශ්‍රිත. නිෂ්පාදන ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීමට පියවර ගෙන ඇති ආකාරය පෙන්නුම් කිරීම

5.3. අස්වැන්න ලබා ගැනීමේ දී සහ එලදාව ලබාගන්නා ස්ථානයේම නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදීමේ දී සිදුවන නාස්තිය අවම කර ගැනීමට හා අනෙකුත් වන සම්පත්වලට වන හානිය අවම කර ගැනීමට වන කලමනාකරුවන් පියවර ගත යුතුවේ.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

5.3.1) අස්වැන්න ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී නාස්තිය සහ ශේෂවන ද්‍රව්‍යවලින් සිදුවන හානිය අවම මට්ටමක පවත්වා ගෙන යාමට පියවර ගැනීම

*උදාහරණ:*
*-අතිරික්ත ලෙස ඇති ශාක ඉවත් කිරීමේදී අන් ශාකවලට හානි නොවන පරිදි ඒවා පොලොව මත පතිත කිරීමට පියවර ගැනීම*

5.3.2) දැව කොටන් ඉරීමේ සහ නිසි පරිදි තේරීම මගින් නිෂ්පාදන අපතේ යාම තත්ත්වයෙන් පහත මට්ටමකට පත්වීම හෝ අදායම් ලබා ගැනීමට ඇති අවස්ථාවන් අහිමිවීම අවම කරයි

5.3.3) දැව කොටන් පොලොවට පතිත කිරීමේ දී පරිසරයට ඇතිවන හානිය අවම වන පරිදි ප්‍රායෝගික වශයෙන් වඩාත් සුදුසු විශාලත්වයෙන් හා අවම ප්‍රමාණයකින් වරකට පොලොව මත පතිත කළ කිරීම.

5.3.4) යම් ස්ථානයක දැව ඉරීම් වැනි කටයුතු සිදු කරන්නේ නම් වන භූමියට හානි නොවන පරිදි එම ස්ථානයේ භූමිය භාවිතා කළ යුතුය. දැව ඉරීම් සහ නිපැයුම් සිදු කිරීමට වන භූමියේ ස්ථානයන් තෝරා ගැනීමේ දී පරිසරයට අවම හානියක් සිදුවන ස්ථාන තෝරා ගැනීමට පියවර ගැනීම

5.3.5) වන පරිපාලකවරුන් විසින් අනිසි ආකාරයෙන් අපතේ යාම් වලකාලීමට පියවර ගත යුතු අතර ක්ෂේත්‍ර උපදේශන මගින් විශාල ගia , දැව කොටන් බවට පත් කිරීමේදී ඉතිරිවන ද්‍රව්‍ය biomass (එනම් අතු රිකිලි කඳේ පොත්ත ආදිය) එම ස්ථානයේම බැහැරලීම ජීවී පද්ධතිවලට ඇති වැදගත්කම දැක්වීම. එමෙන්ම ගස් කපා ඉවත්කළ විට එහි ඉතිරිවන දෑ එම ස්ථානයෙන් ඉවත් නොකිරීමේ ඇති වැදගත්කම පිළිබඳව උපදේශන මාලාවන ලිඛිතව දක්වා තිබීම.

5.4) දේශිය ආර්ථිකය ශක්තිමත් කිරීම පිණිස වන පරිපාලකවරුන් විසින් එක් නිෂ්පාදනයක් මත යැපීම වෙනුවට විවිධත්වය කරා එළෙඹීමට පියවර ගැනීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

5.4.1) වන භූමියෙන් ලබා ගන්නා වූ වානිජමය වටිනාකමක් ඇති නිෂ්පාදන විවිධත්වයකින් යුක්තව වෙළඳපොලට නිකුත් කර ඇති බව වන පරිපාලකවරුන් විසින් තහවුරු කිරීම

5.4.2) දේශිය නිෂ්පාදනවලට වටිනාකමක් එක් කිරීම value-added උත්සාහ ගැනීම වන පරිපාලකවරුන් විසින් තහවුරු කිරිම

5.4.3) වෙළඳපොල අවස්ථාවන් ඇති හා වනාන්තර ජීවී පද්ධතියේ තුළිත බවට හානි නොවන ආකාරයේ දැව නොවන නිෂ්පාදන වෙළඳපොලට එක් කිරීමට වන කලමනාකරුවන් විසින් පියවර ගෙන තිබීම.

*උදාහරණ:*
*-විකල්ප භාවිතයන් එනම් විනෝදාත්මක කටයුතු සංචාරක කටයුතු ecotourism දඩයම් මසුන් මැරීම් වැනි ක්‍රීඩා රබර් කිරි කැපීම නත්තල් ගස් කැපීම වැනි දෑ*

5.5 වන කලමනාකරණ ක්‍රියාවලියේ දී එම සේවාවන් පුළුල් කිරීම පිණිස සුදුසු පරිදි ජලමූලාශ්‍ර ධීවර වැනි සම්පත් හඳුනාගැනීම, නඩත්තු කිරීම හා වටිනාකම ඉස්මතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

5.5.1) අදාල වන භූමියේ සියලු සේවාවන් එනම් පොදු ජල මූලාශ්‍ර, වානිජ මට්ටමෙන් සහ විනෝදාංශයක් වශයෙන් මසුන් මැරීම (පහත් බිම්වල ධීවර කටයුතුවල නියැලීමට ජල ප්‍රවාහයන්ට ජලය මුදා හැරීම) දර්ශනීයත්වය, කලාපයේ ජෛව විවිධත්වයට

දායකත්වය, විනෝදාත්මක කටයුතු, සංචාරක සේවාවන් කෙරෙහි කලමනාකරණ සැලසුම මගින් අවධානය යොමු කිරීම.

5.5.2) වනයෙන් ලබා ගන්නා දැව ආශ්‍රිත කලමනාකරණ කටයුතු සැලසුම් කිරීමේ දී එයට ඇති අවකාශය පිලිබඳ අවධානය යොමු කිරීම මෙන්ම වන ආශ්‍රිත වෙනත් සේවාවන්වලට ඇතිවන බලපෑම් කෙරෙහි සැලකිල්ලද යොමු කිරීම.

5.5.3) වන පරිපාලකවරුන් විසින් දැව වලට අමතරව වන ආශ්‍රිත එහෙත් බොහෝ අවස්ථාවන්හිදී ආදායම් නොලැබෙන සේවාවන් පිලිබඳව දැණුවත්වීම සහ ඒ පිලිබඳව සංවේදී වීම.

5.5.4) වන භූමිය ආශ්‍රිත කටයුතු සඳහා බලපෑම් ඇතිවිය හැකි සේවාවන් පිලිබඳව අදාල පාර්ශවකරුවන් හා නිරන්තර සංවාදයට එළඹීම හා අදහස් උපදෙස් ලබා ගැනීමට වන පරිපාලකවරුන් පියවර ගෙන තිබීම.

5.5) අදාල වන භූමියෙන් ලැබෙන නිෂ්පාදන (අස්වැන්න) එම භූමියේ තිරසාර පැවැත්මට තර්ජනයක් වන ආකාරයෙන් ලබා නොගත යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

5.6.1) වානිජමය පදනමක් මත දැව කැපීම සිදුවන විට එම ක්‍රියාවලිය සිදු කළ යුතු ප්‍රමාණය සහ වාර ගණන ආදි කරුණු දැව කලමනාකරණ සැලසුම මත පදනම් වීම අතර එම සැලසුමට කැපිය යුතු දැව ප්‍රමාණය සහ කාල අන්තරයන් ද ඇතුලත් කිරීම.

**5.7.** වාර්ෂික දැව කැපීම ඒ සඳහා අනුමත ගණනය කළ ප්‍රමාණය ඉක්මවා නොකිරීම **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

5.7.1) යම් වන භූමි ප්‍රමාණයක සිදුවන වානිජ ක්‍රියාවලිය සහ එහි විශාලත්වය අනුව රෝපනය කළ යුතු පැල සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම - ශාක විශේෂය සහ කුලය ආදි වශයෙන් මෙම ගණනය සිදු කළ යුතු අතර එහිදී දැනට පළ කර ඇති ලිපිලේඛන සහ පළ පුරුද්ද අනුව ශාකවල වැඩීම ආදිය තීරණය කළ හැකිය.

5.7.2) වගා කිරීමට රුචි ශාක විශේෂ වර්ග යම් කාල පරාසයක් තුළදී අපේක්ෂිත ප්‍රමාණයෙන් වර්ධනයවීම. (කලමනාකරණ සැලසුමේ විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවකදී හැර) දැනට රෝපනය කර ඇති විශේෂ ප්‍රශස්ත මට්ටමට ළගාවීම හෝ එය ඉක්මවා යාම.

5.7.3) යම් වන භූමි ප්‍රදේශයක වාර්ෂිකව දැව කැපීම සිදුවන්නේ නම් 10 වසරක සැලැස්මක දක්වා දැව කැපීමේ ප්‍රමාණය සාමාන්‍යය දල වර්ධනය ඉක්මවා නොයා යුතුය.

5.7.4) කුඩා ප්‍රමාණයේ භූමි භාගයක එනම් වාර්ෂිකව දැව කැපීම සිදු නොවන අවස්ථාවන්හිදී ශාක නියමිත පරිදි වැඩීමට ඇති කාලය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව දැව කැපීමට නියමිත කාල අන්තර ගණනය කිරීම

5.7.5) දැව නොවන වෙනත් නිෂ්පාදන එනම් රබර් වගාව ආදිය සැලකිල්ලට ගැනීමේ දී එහි වඩාත් හොඳම නිෂ්පාදන ඉලක්කයක් සපුරා ගත හැකි අයුරින් ක්‍රමෝපායන් භාවිතා කරමින් කාල අන්තරයන් ගණනය කිරීම. මෙහිදී අංක **5.6.2** යටතේ දක්වා ඇති කරුණු සැලකිල්ලට ගත යුතුවේ.

**නියාමන අංක 6: පාරිසරික බලපෑම්**

වන කළමනාකාරිත්වය විසින් ජෛව විවිධත්වය හා එයට අදාල වටිනාකම් එනම් ජලය, වෙනත් සම්පත්, පස සහ විශේෂිත සහ තර්ජනයට පහසුවෙන් ලක්විය හැකි ජීවී පද්ධතීන් සහ භූමි ලක්ෂණ ආදිය ආරක්ෂා කළ යුතුය. එසේ කිරීමේ දී ජෛව ක්‍රියාකාරකම් සහ වන භූමියේ අඛණ්ඩතාවය ද නඩත්තු කළ යුතුය.

6.1. පාරිසරික බලපෑම් ඇගයීම Environmental Impact Assessment සම්පූර්ණ කළ යුතුය - එය වන කළමනාකරණයේ පරිමානයට තීව්‍රතාවයට සහ බලපෑම් ඇතිවන සම්පත්වල විශේෂත්වයට අනුකූල විය යුතු අතර කළමනාකරණ ක්‍රමවේදයට ප්‍රමාණවත් අයුරින් ඒකාබද්ධ කළ යුතුය. මෙම තක්සේරුවේ දී භූමි රටාවන් සැලකිල්ලට ගැනීම මෙන්ම එම ස්ථානයේදීම නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කිරීම වැනි කරුණු කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. පරිසරයට බලපාන ක්‍රියාවලියන් ඇරඹීමට ප්‍රථමයෙන් පාරිසරික ඇගයීම් සිදු කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.1.1) යම් පරිශ්‍රයකට බලපෑම් ඇතිවන ක්‍රියාවලියක් ඇරඹීමට ප්‍රථමයෙන් ක්‍රමානුකූල අයුරින් ව්‍යාපෘති මට්ටමෙන් පාරිසරික බලපෑම් ඇගයීම සිදු කිරීම හා ව්‍යාපෘතියේ (පරිශ්‍රයේ) ප්‍රමාණය සහ ක්‍රියාවලියේ සංකීර්ණත්වය අනුරූපව එය සිදු කිරීම.

6.1.2) ව්‍යාපෘති මට්ටමේ තක්සේරුවට අමතරව වන පරිපාලකවරුන් විසින් භූමිය පිහිටා ඇති ආකාරයට අනුකූලව බලපෑම් තක්සේරුවක් සිදු කිරීම. එමගින් මෙම ක්‍රියාවලියේ සම්පූර්ණ බලපෑම සැලකිල්ලට ගැනීම

6.1.3) පාරිසරික බලපෑම් ඇගයීම (තක්සේරුව)ට පසුබිමක් වශයෙන් සැලකිල්ලට ගන්නා ලද වන භූමි ප්‍රදේශයේ ක්‍රියාවලියේ පරිමානය සහ තිව්‍රතාවය අනුව කලාපීය උප කලාපීය සහ භූමි පිහිටි ආකාරය අනුව හඳුනාගැනීම සහ ලේඛන ගත කිරීම. (කළමනාකරණ සැලසුමට ඇතුලත් කිරීම සුදුසුය)

6.1.4) පාරිසරික ඇගයීම් තක්සේරුවේ ප්‍රතිඵල මත කළමනාකරණ සැලසුම් ඇති ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වෙනස්කම් ආදිය සිදු කිරීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කළමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි

6.1.5) ඇතිවිය හැකි අහිතකර බලපෑම් ගැන අවබෝධය හා ඒවා අවම කර ගැනීමට ගත හැකි පියවර පෙන්නුම් කිරීම

6.2. දුර්ලභ තර්ජනයට ලක්වූ හා විනාශ වෙමින් පවතින ශාක සහ සත්ව විශේෂයන් ඔවුන් ගේ වාසස්ථාන (උදා කැදලි සහ ආහාර ලබා ගන්නා ප්‍රදේශ) ආදිය තුළම ආරක්ෂා කිරීම. බලපෑම් ඇතිවන සම්පත්වල විශේෂත්වය අනුව හා වන භූමියේ සිදුවන ක්‍රියාකාරකම්වල පරිමානය සහ තිව්‍රතාවය අනුව ආරක්ෂිත කලාප සහ ආරක්ෂිත ප්‍රදේශ ස්ථාපනය කිරීම. අනිසි ආකාරයෙන් දඩයම් කිරීම් මසුන් මැරීම සහ උගුල් ඇටවීම ද සම්පත් රුස් කිරීම ද පාලනය කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.2.1) වන පරිපාලකවරුන් විසින් ප්‍රාදේශිය, පළාත් සහ මධ්‍යම රජයේ මෙම කාර්යයට අදාල හා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් හා නිසි ආකාරයේ රාජකාරි සම්බන්ධතා ඇති කර ගැනීම හා පවත්වාගෙන යාම.

6.2.2) ක්ෂේත්‍ර අධ්‍යයනයන් හෝ වෙනත් ක්‍රම මගින් මගින් තර්ජනයට ලක්ව ඇති ගත කර ඇති සත්ව හා ශාක විශේෂ හා ඔවුන් ගේ වාසස්ථාන හඳුනාගැනීම එමෙන්ම අස්වාභාවික ලෙස වර්ධනය වී ඇති විශේෂ හා/හෝ ජෛව විවිධත්වයකින් යුත් ජෛව පද්ධති ආදිය හඳුනා ගැනීම. වන භූමි ප්‍රදේශයේ ක්‍රියාකාරකම් හා සංකීර්ණත්වයට අනුකූලව මෙම විශේෂ වර්ග ආරක්ෂා කර ගැනීමටත් එමෙන්ම එහි අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගත හැකි පරිදි කළමනාකරණය කිරීමටත් පියවර ගැනීම

6.2.3) අවදානමට හෝ තර්ජනයට ලක්ව ඇති ජීවී විශේෂයන් හා ඔවුන් ගේ වාසස්ථාන හඳුනාගැනීමට ක්ෂේත්‍ර නිලධාරින් පුහුණු කර තිබීම.

6.2.4) අවධානයට ලක්විය යුතු තර්ජනයට ලක්ව ඇති ශාක සහ සත්ව විශේෂ නිසි ආකාරයෙන් හඳුනා ගැනීමටත් කළමනාකරණය කිරීමටත් සුදුසු පරිමානයෙන් යුතු සිතියමක සිතයම් ගත කිරීමටත් පියවර ගැනීම

6.2.5) අනවසරයෙන් දඩයම්කිරීම ධීවර කටයුතුවල නියැලීම උගුල් ඇටවීම හෝ අවදානමට ලක්ව ඇති ශාක හා සත්ව විශේෂ ආදිය රුස් කිරීම ආදි ක්‍රියාවන් අවම කිරීම හා පාලනය කිරීම

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කළමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි

6.2.6) අනවසරයෙන් සතුන් දඩයම මසුන් ඇල්ලීම උගුල් ඇටවීම හා රුස් කිරීම වැනි කටයුතු පාලනය කිරීමට පියවර ගෙන තිබීම

6.2.7) දුර්ලභ තර්ජනයට හා අවදානමට ලක්ව ඇති ශාක සහ සත්ව විශේෂ ඇති බවට තොරතුරු ලැබී ඇතිවිට එම විශේෂ වාසය කරන ස්ථාන සිතියම් ගත කර ඒවා ආරක්ෂා කිරීමට වන පරිපාලකවරුන් පියවර ගෙන තිබීම

6.2.8) සංරක්ෂණය සඳහා වැදගත්වන ජිවී පද්ධති ආදිය හඳුනාගැනීම සහ ආරක්ෂා කිරීම

ජිවී පද්ධතිවල ක්‍රියාකාරිත්වය එසේම පවත්වා ගෙනයාම වර්ධනය කිරීම හෝ සංරක්ෂණය කිරීම එයට පහත දැක්වෙන ක්‍රියා අඩංගු විය හැකිය.

1- ප්‍රතිරෝපනය (නැවත වගා කිරීම)
2- ජාන විශේෂ සහ ජිවී පද්ධතිවල විවිධත්වය
3- වන ජිවී පද්ධතිවල ඵලදායිතාවට බලපාන ස්වභාවික චක්‍රයන්

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.3.1) දැනුවත්ව ඇති ජිවී පද්ධති ක්‍රියාකාරකම් සහ වටිනාකම් පිළිබඳව කලමනාකරණ සැලසුමේ විස්තර කිරීම සහ අමතර තොරතුරු/දැනුවත්වීම් ලද විගස යාවත්කාලීන කිරීම. වන පරිපාලකවරුන් විසින් ජිවී අදාල වන භූමි ප්‍රදේශයේ ඇති ජිවී පද්ධති පිළිබඳ නොදන්නා තොරතුරු සහ දැනුම ලබා ගැනීමට වෑයම් කිරීම

6.3.2) ක්‍රියාකාරකමේ පරිමානය අනුව පසු කලෙක වුවද ස්වභාවික විවිධත්වය විසිරී පැවතෙන ආකාරයෙන් සම්පූර්ණ වන ගහණ පරාසය පැවැත්වෙන පරිදි වන කලමනාකරණ කටයුතු සිදු කිරීම.

6.3.3) කලමනාකරණ සැලසුමට භූමි රටාවන් සහ ජිවිපද්ධති මත පදනම් වූ මූල ධර්ම ඇතුලත්වීම. මෙම සැලසුමට ජීවවිද්‍යාත්මක ජාන විවිධත්වයේ genetic diversity සිට භූමි රටා landscape විවිධත්වය දක්වා විවිධත්වයට අදාල අවකාශ පරිමානයන් spatial scales හා එයට අදාල ඉලක්ක goals ඇතුලත් කිරීම.

6.3.4) අස්වැන්න නෙලා ගැනීමට අදාල නිර්දේශයන් වන භූමියේ සංයුතිය නඩත්තු කිරීමට වර්ධනය කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට සැලකිල්ලට ගනිමින් සකස් කිරීම. ස්වභාවික වශයෙන් සිදුවන් විශේෂත්ව වර්ධයන් ඒ ආකාරයෙන් නඩත්තු කිරීමට කලමනාකාරිත්වයේ අරමුණ වීම

6.3.5) අස්වැන්න නෙලීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී කාලය හා අවකාශය මත පදනම්ව මෙම ක්‍රියාවලිය නිසා ස්වභාවික වශයෙන් පරිසරයට හා ජිවී වාසස්ථානවලට ඇතිවන බලපෑම් එහි පරිමානය එය සිදුවන ආකාරය සහ වාර ගණන වැනි කරුණු සැලකිල්ලට ගැනීම.

6.3.6) අවසන් අස්වැන්න නෙලා ගත් පසු ප්‍රතිරෝපණය නියමිත කාලයට අනුව සාර්ථකව ඉටු කිරීම. මෙහි ඇති පැල රෝපණය කිරීම හෝ ස්වභාවිකව වැඩී ඇති අතර එහි අවශ්‍ය විශේෂයන් දකින්නට ලැබේ. මෙම පැල ශක්තිමත් සහ ජාතිජ වශයෙන් සුදුසු විශේෂවීම.

6.4. භූමි රටාවන් අනුව එහි පවතින ජීවි පද්ධතිය නිරූපිත නියැදියක් (සාම්පලයක්) එහි ස්වභාවික පරිසරයේ දී ස්වභාවික ආකාරයෙන්ම ආරක්ෂා කිරීම. ක්‍රියාවලියේ පරිමානය සහ තීව්‍රතාවය අනුව මෙන්ම සම්පත්වල ඇති විශේෂත්වය ද සැලකිල්ලට ගනිමින් එය සුදුසු පරිමානයකට අනුව සිතියම් ගත කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.4.1) කලාපයේ භූමි රටාවන් තුළ දැනට පවතින ජීවි පද්ධති නිරූපණය කරමින් සංරක්ෂිත ආදර්ශ නියැදියන් (සාම්පල) කීයක් තිබේදැයි යන්න වන පරිපාලකවරුන් විසින් විමසා බැලීම.

6.4.2) මෙම භූමිරටාවන් තුළ යම් ඌණතාවයන් පවතින්නේ නම් වන පරිපාලකවරුන් විසින් එම ජාලයන්ට දායකවීමට යම් පියවර ගැනීම

නිර්වචනය කර ඇති භූමිය තුළ සංරක්ෂිත ප්‍රදේශ සිතියම් මගින් නිරූපණය කිරීම සහ ඒවා සංරක්ෂණය කිරීමේ ප්‍රතිපත්ති ආදිය කලමනාකරණ සැලසුමට ඇතුලත් කිරීම

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

6.4.3) ජීවි පද්ධතිවල ආදර්ශ නියැදියන් හඳුනාගැනීම සිතියම්ගත කිරීම සහ ඒවා අස්වැන්න නෙලා ගන්නා ප්‍රදේශවලට ඇතුලත් නොකිරීම. කලාපයේ අන් පෞද්ගලික හෝ පොදු අයිතිය ඇති ප්‍රදේශවල එවැනි ජීවි පද්ධති පවතින්නේ නම් මීට අමතරව තවත් ජීවි පද්ධති ආදර්ශ පවත්වා ගැනීම හෝ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පැණ නගින්නේ නැත.

6.5. පාංශු ඛාදනය, අස්වැන්න ලබා ගන්නා අවස්ථාවේදී, මාර්ග සකස් කිරීමේ දී සහ අනෙකුත් සියලු යන්ත්‍රසූත්‍ර ආධාරයෙන් සිදුකරන ක්‍රියා කලාපයන් නිසා වනයට සිදුවන හානිය පාලනය කිරීමට අදාල උපදේශන මාලාවක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම. එය ලිඛිතව ඉදිරිපත් කිරීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.5.1) කලමනාකරණ සැලසුම හෝ වෙනත් අදාල ප්‍රතිපත්ති ලේඛන මගින් පරිශ්‍රයේ සිදුකරන විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් පාංශු ඛාදනය (පස සේදියාම) හා වන ශාක පද්ධතියට සිදුවන හානිය අවම කර ගැනීමට අවශ්‍ය උපදෙස් මාලාවක් ඉදිරිපත් කිරීම

6.5.2) කලමනාකරණ සැලසුම හෝ වෙනත් අදාල ප්‍රතිපත්ති ලේඛන මගින් වන භූමියේ ඇති ජල සම්පත් (උදා - ඇල මාර්ග ගලා යන ජලය තෙත් බිම් ජල උල්පත් ආදිය) ආරක්ෂා කර ගැනීමට අවශ්‍යය කරුණු ඇතුලත්වීම

6.5.3) වන පරිපාලකවරුන් සහ සේවකයින් වන සංරක්ෂණය පිලිබඳ ලබාදී ඇති මෙම උපදෙස් පිලිබඳ මනා දැනුමක් තිබීම සහ ඔවුන් ගේ දෛනික කාර්යයන් ඉටු කිරීමේ දී එම දැනුම උපයෝගී කර ගැනීම

6.5.4) සියලු ජල මූලාශ්‍රයන් සහ වෙනත් ජල ආශ්‍රිත ස්වභාවික සම්පත් හඳුනාගැනීම වර්ගීකරණය සහ සිතියම්ගත කිරීම

6.5.5) ක්ෂේත්‍රයේ මාර්ග තැනීම නඩත්තුව හා වසා දැමීම ආදිය නිසි තත්වයකට අනුකූලව සිදු කිරීම. මාර්ග මතුපිට ජලය බැසයාම මනා ලෙස සකස් කර තිබීම ජල මට්ටම ඉහල යන අවස්ථාවන්හිදී බෝක්කු හා ජල පවහන පද්ධතීන්ට ඒම වැඩිවන ජල ප්‍රමාණය දරා ගැනීමට හැකිවීම. ජල රෝධක water bars ආදිය නිසි ආකාරයෙන් සකසා තිබීම.

6.5.6) ඉතාමත් අවදානම් බෑවුම් හෝ නායයාම්වලට වැඩි ප්‍රවනතාවක් ඇති ප්‍රදේශවල ගස් කැපීම ආදියෙන් වැලකී සිටීම

**6.6.** පරිසරහිතකාමී රසායන ද්‍රව්‍ය භාවිතා නොකරන කෘමි පාලන ක්‍රම සකස් කිරීම සහ ඒවා භාවිතා කිරීමට කලමනාකරණ සැලසුම විසින් අවධානය යොමු කිරීම. ලෝක සෞඛ්‍ය සංවිධානය වර්ග 1A සහ 1B කාණ්ඩයට අයත් ක්ලෝරිනේටඩ් හයිඩ්‍රෝකාබන් කෘමිනාශක: දිගින් දිගටම විනාශ නොවී පවතින කෘමිනාශක වර්ග: විෂ සහිත හෝ කෘමිනාශකවල ඉතිරිවන කොටස් ජීව විද්‍යාත්මකව ක්‍රියාත්මක වන සහ ඉන් අපේක්ෂිත තත්ත්වයන් ඉක්මවා යමින් ආහාර දාමය තුළ රුස්වන වර්ග: ජාත්‍යන්තර එකගතාවන් මගින් තහනම් කළ කෘමිනාශක වර්ග ආදිය භාවිතය තහනම් කිරීම. රාසායන ද්‍රව්‍ය භාවිතා කිරීමේදී ඒ සඳහා නිසි උපකරණ සහ පුහුණු ලබාදීම මගින් සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන හානිය අවම කිරීම - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරැරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.6.1) සියලු කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා කිරීමේ දී ඒවා ඒකාබද්ධ කලමනාකරණ වැඩසටහනක් තුළ පාලනය කිරීම. කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා කරන්නේ විකල්ප ක්‍රමවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි අවස්ථාවන්හිදී පමණි.

**6.6.2)** අදාල වන භූමිය ආශ්‍රිතව භාවිතා කරන සියලු කෘෂි රසායන ද්‍රව්‍යවල සම්පූර්ණ ලැයිස්තුවක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම. එම ලැයිස්තුව විගණන නිලධාරීන්ට අවශ්‍යවිට ඉදිරිපත් කිරීම. FSC හි විශේෂ අනුමැතියක් ඇති අවස්ථාවකදී හැර **6.6** මගින් දක්වා ඇති කිසිදු කෘෂි රසායන ද්‍රව්‍යක් භාවිතා කිරීමෙන් වැලකී සිටීම - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරැරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

6.6.3) භාවිතා කරන සියලු කෘෂි රසායන ද්‍රව්‍ය එක් එක් පරිශ්‍රයට අදාල විශේෂ කරුණු ඇතුලත් ලිඛිත උපදෙස් සහිත විය යුතු අතර එමගින් මනුෂ්‍යයාට සහ පරිසරයට වන හානිය වලකාලමින් උපරිම ප්‍රයෝජනය අත්වන අයුරින් භාවිතා කිරීමට හැකිවීම.

6.6.4) ක්ෂේත්‍රයේදී කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා කරන සේවකයින් ඒ සඳහා සුදුසුකම් ලත් (අදාල අවස්ථාවන්හිදී) සහ පුහුණුව ලැබූ පිරිසක්වීම. එමෙන්ම භාවිතය සඳහා නිසි උපකරණ සහ ආරක්ෂක මෙවලම් ආදිය ලබාදීම.

6.6.5) වන පරිපාලකවරුන් විසින් කෘෂි රසායන ද්‍රව්‍යය භාවිතය අවම කර ගැනීමට හා කල්යත්ම ඉන් සම්පූර්ණයෙන්ම ඉවත්වීමට සැලසුම් කිරීම හා එයට කැපවීම.

6.7. රසායන ද්‍රව්‍ය, ඇසුරුම්, ඉන්ධන සහ තෙල් ඇතුළු කාබනික නොවන ද්‍රව සහ ඝන අපද්‍රව්‍ය පරිසරහිතකාමී හා සුදුසු අයුරකින් පරිශ්‍රයෙන් පිටත ස්ථානයකට බැහැරලීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.7.1) විෂ සහිත රසායන ද්‍රව්‍ය සහ ඒ ඇසුරුම් ආදිය පරිශ්‍රයෙන් පිටත පාරිසරික වශයෙන් හානි නොවන සහ නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි බැහැරලීම.

6.7.2) අනපේක්ෂිත අයුරින් කෘමි රසායන ඉන්ධන සහ තෙල් ආදිය වැගිරීම් සිදුවූ විට ඒවා පිරිසිදු කිරීම හා එවැනි අවස්ථාවන් ඇති නොවීමට සැලසුම් සහ අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටයන්.

6.7.3) තෙල් සහ ඉන්ධන ඇතුළු අනෙකුත් බැහැරලන ද්‍රව්‍යය රැස් කිරීමට පරිශ්‍රයේ පහසුකම් සලසා තිබීම.

6.8. ජීව විද්‍යාත්මක පාලනයන් biological control agents භාවිතා කරන අවස්ථාවන්හිදී එය නියමිත පරිදි ලේඛන ගත කර අවම මට්ටමකින් නිසි පසුවිපරමකින් සහ දැඩි පාලනයකින් යුක්තව සිදු කළ යුතුය. එමෙන්ම දේශීය නීතිරීති මෙන්ම අන්තර්ජාතික සම්මුතීන්ට ද අනුකූලව භාවිතා කළ යුතුය. ජාන වෙනස් කිරීම් මගින් උත්පාදනය කළ ජෛන්ද්‍රියන් genetically modified organisms භාවිතය තහනම් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

**6.8.1)** අදාල වන භූමිය තුළ ජාන වෙනස්කම් මගින් උත්පාදනය කළ ජෛන්ද්‍රියන් (වානිජ හෝ පර්යෝපණ මට්ටමින්) භාවිතා නොකිරීම. - **මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

6.8.2) ජීවවිද්‍යාත්මක පාලනයන් සියල්ල සිදුවිය ඇත්තේ කෘමි හෝ අනෙකුත් වසංගත උවදුරු මැඩලීමට ඇති ඒකබද්ධ සැලසුමට අනුකූලවය. එමෙන්ම ඒ සියල්ල ලේඛනගත කිරීම අවම මට්ටමකින් සිදු කිරීම සහ නිසි ආකාරයෙන් පසුවිපරම් කිරීම සහ පාලනය කිරීම අත්‍යාවශ්‍යවේ.

6.8.3) ජීව විද්‍යාත්මක පාලනයන් භාවිතා කළ යුත්තේ එය අත්‍යාවශ්‍ය බව පෙන්නුම් කරන අවස්ථාවේදීය. එමෙන්ම එය අදාල නීතිරීති සහ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ සිදු කිරීම.

6.9. ආගන්තුක විශේෂ භාවිතය දැඩි ප්‍රවේශම්කාරී පාලනයකට නතු කළ සිදු කළ යුතු අතර ඉන් ජීවී පද්ධතීන්ට ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට එය හොඳින් පසුවිපරම් කළ යුතුය

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.9.1) ආගන්තුක විශේෂයන් (ශාක වර්ග මෙන්ම අනෙකුත් තුරුලතා හා සත්ව විශේෂ) යම් වන භූමියකට හඳුන්වාදිය යුත්තේ එම වර්ග මගින් අදාල භූමියට අහිතකර බලපෑම් ඇති නොවන බව හොඳින් සොයා බලා තහවුරු කර ගැනීමෙන් අනතුරුවය.

6.9.2) ආගන්තුක විශේෂයන් භාවිතා කළ යුත්තේ එය අදාල ප්‍රදේශයෙන් පිටත නැවත උත්පාදනය නොවන ආකාරය තහවුරු කරන ලිඛිත උපදෙස් මාලාවක පාලනය යටතේය. එමෙන්ම ඒ සඳහා ක්‍රියාකාරි පසුවිපරම් ක්‍රමවේදයක් තිබීම

6.9.3) යම් ප්‍රදේශයක ආගන්තුක ශාක විශේෂයන් ගෙන් ගැටළු සහගත තත්ත්වයක් පැණ නැගී විට වන පරිපාලකවරුන් විසින් එය පාලනය කිරීමට සුදුසු පියවර සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

6.10. යම් වන භූමියක් වතු වගාවක් හෝ වන-වගාවක් නොවන භූමියක් ලෙස පරිවර්තනය කිරීමෙන් වැලකිය යුතුය. එසේ කළ යුත්තේ පහත අවස්ථාවන්හිදී පමණි.:

a) එම භූමි ප්‍රමාණය වන භූමියෙන් ඉතාමත් සීමිත කොටසක් පමණක් වීම ;සහ

b) වටිනාකමෙන් ඉහල වන භූමියක් නොවීම සහ ;

c) මෙම පරිවර්තනය හේතුවෙන් වන කලමනාකරණ ඒකකයට පැහැදිලි සැලකිය යුතු ප්‍රමාණයක දැනට පවතින ප්‍රමාණයට වඩා වැඩි ප්‍රතිලාභ අත්පත්වන බව පෙන්වා සිටීම - **මේ නියාමනයන්ට අනුකුල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

6.10.1) අදාල වන භූමියෙන් 5% කට අඩු ප්‍රමාණයක්(1994 සිට) වගාවකට හෝ වන-වගාවක් නොවන භාවිතයකට පරිවර්තනය කර තිබීම හෝ පරිවර්තනය කිරීමට පියවර ගැනීම ( FSC ආයතනයේ තිර්ණායකන්ට අනුව)

6.10.2) ඉහල වටිනාකමකින් යුත් සංරක්ෂිත වන භූමි වගාවන් හෝ වන-වගා නොවන අන් භාවිතයන් සඳහා යොදා ගැනීමෙන් වැලකී සිටීම.

6.10.3) වන වගාවක් වගාවකට හෝ අන් භාවිතයකට යොදා ගෙන තිබේ නම් ඉන් දිගු කාලීන ප්‍රතිලාභ අත්පත් වන බව වන පරිපාලකවරුන් විසින් තහවුරු කිරීම

**නියාමන අංක 7: කලමනාකරණ සැලසුම**

ක්‍රියාත්මක කරන පරාසයට සහ තිව්‍රතාවයට අනුකුල වන පරිදි කලමනාරණ සැලැස්මක් සකස් කිරීම එය ලේඛනගත කිරීම ක්‍රියාත්මක කිරීම සහ යාවත්කාලීන කිරීම. මෙම සැලැස්මේ දිගුකාලීන අරමුණු සහ ඒවා සාක්ෂාත් කර ගන්නා අකාරය පැහැදිලි ලෙස දක්වා ඇත.

7.1. කලමනාකරණ සැලසුම සහ ඊට අදාල ලේඛන මගින් පහත තොරතුරු සැපයේ:

a) කලමනාකරණ ක්‍රියාවලියේ අරමුණු.

b) කලමනාකරණය කිරීමට අදාල සම්පත් පිළිබඳ විස්තර, පාරිසරික සීමාවන්, භූමි භාවිතය සහ අයිතිය, සමාජ-ආර්ථික තත්ත්වයන්, ආසන්නව පිහිටි භූමි පිළිබඳ ලක්ෂණ ඇතුලත් හරස්කඩක් (land profile)
c) අදාල වන භූමියේ ජීවි පද්ධතිය මත පදනම්ව වන වගාව හා/හෝ අන් කලමනාකරණ ක්‍රම පිළිබඳ විස්තර සහ අනෙකුත් සම්පත් පිළිබඳ රැස් කරගන්නා ලද තොරතුරු
d) තෝරා ගත්. විශේෂයන් සහ වාර්ෂික අස්වැන්න පිළිබඳ තාර්කාන්විතය. (තෝරා ගැනීමට හේතු දැක්වීම).
e) වන වගාවේ වැඩීම සහ ගතිකත්වය පසුවිපරම් කිරීමට ඉඩකඩ (forest growth and dynamics.)
f) පාරිසරික තක්සේරුව මත පදනම්වූ පරිසරික සුරක්ෂිතතාවය.
g) දුර්ලභ හා වඳවීයාමේ තර්ජනයට ලක්වූ විශේෂ හුදුනාගැනීම සහ ආරක්ෂා කිරීමට අදාල සැලසුම්.
h) සංරක්ෂිත ප්‍රදේශ සැලසුම්කරණ ලද කලමනාකරණ කටයුතු සහ ඉඩම් හිමිකාරිත්වය ආදී කරුණු ඇතුලත්වූ වන සම්පත් සලකුණු කරන ලද සිතියම්.
i) අස්වැන්න ලබා ගැනීමට භාවිතා කරන තාක්ෂණය සහ උපකරණ පිළිබඳ විස්තර සහ ඒවා භාවිතා කිරීමට හේතු පැහැදිලි කිරීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

7.1.1) අදාල වන භූමියේ ක්‍රියාවලියේ පරිමානයට තීව්‍රතාවයට සංකීර්ණත්වය අනුකූලව ලිඛිත කමනාකරණ සැලැස්මක් සකස් කිරීම. මෙම සැලසුමේ ඉහත දැක්වෙන විෂය කරුණු ඇතුලත් විය යුතුය. **- මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරැරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

7.1.2) මෙම සැලැසුමේ දිගු කාලීන ඉලක්ක අරමුණු මෙන්ම කෙටිකාලීන ක්‍රමෝපායන් සහ දිශානතීන් tactical direction ඇතුලත්විය යුතුය.

7.1.3) අපේක්ෂිත ක්‍රියාවලියන් ඉටු කර ගැනීමට හැකි කාර්යක්ෂම සැලසුමක ඇතුලත් කර ඇති සංවර්ධන ක්‍රියාවලිය සපුරා ගැනීම සඳහා ආයෝජනයට ප්‍රමාණවත් සම්පත් තිබීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

7.1.3) ලිඛිත කලමනාකරණ සැලසුමක් තිබීම සහ එය ක්‍රියාත්මක කිරීම. කලමනාකරණ සැලසුමේ අවම වශයෙන් පහත දැක්වෙන කරුණු ඇතුලත් විය යුතුය.

a) කලමනාකාරිත්වයේ අරමුණු
b) වන භූමිය පිළිබඳ විස්තරයක්
c) අරමුණු ළගා කර ගන්නා අකාරය. අස්වැන්න ලබා ගන්නා ආකාරය(සම්පූර්ණ වන ගහනය කපා ගැනීම තෝරා ගත් ශාක කැපීම සහ ශාක අඩු කිරීම) සහ තිරසාරබව තහවුරු කර ගැනීම සඳහා වූ වනරෝපනය

d) තිරසාරබව තහවුරු කර ගැනීම සඳහා අස්වැන්න ලබා ගත යුතු සීමාවන් (එය 5.6 ට අනුකූල විය යුතුය)
e) වන වගාව වැඩීම පසුවිපරම් කිරීමේ සැලසුම්
f) සැලසුමේ පාරිසරික/සමාජීය බලපෑම්
g) දුර්ලභ විශේෂ සංරක්ෂණය සහ සංරක්ෂිත ප්‍රදේශ කලමනාකරණ සැලස්ම සහ භූමි අයිතිය සිතියම් ගත කිරීම
h) වල්පැලෑටි සහ කෘමි උවදුරු ආදිය පාලනයට අදාල සැලසුම
i) සැලසුමේ කාලය.

7.2. පසුවිපරමේ ප්‍රතිඵල හෝ නව තාක්ෂණික සහ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කර ගැනීමට මෙන්ම වෙනස්වන පාරිසරික තත්ත්වයන් සමාජ-ආර්ථික බලපෑම් ආදිය ඇතුලත් කර ගැනීමට කලමනාකරණ සැලසුම වරින් වර වෙනස් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

7.2.1) කලමනාකරණ සැලසුම නිසි කාලවකවානුවලදී සංශෝධනයට ලක් කිරීම සහ යාවත්කාලීන කිරීම. එම කාලවකවානුව තීරණය කරනු ලබන්නේ ක්‍රියාවලියේ පරාසය සහ තිව්‍රතාවය මතය.

7.2.2) අදාල වන භූමියේ කලමනාකාරිත්වයට බලපාන නව විද්‍යාත්මක සහ තාක්ෂණික තොතරුරු පිළිබඳව වන පරිපාලකවරුන් දැනුවත් වීම සහ දැණුවත්වීම සඳහා වැඩ පිළිවෙලක් තිබීම

7.2.3) කලමනාකරණ සැලසුම අදාලව සහ යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කලමනාකරණය සඳහා උපදේශ නිරන්තරයෙන්ම ලබාදීමට හැකිවීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

7.2.4) කලමනාකරණ සැලසුම නිසි කාලවකවානුවලදී සංශෝධනයට ලක් කිරීම සහ යාවත්කාලීන කිරීම. එමම කාලවකවානුව ක්‍රියාලියේ පරාසය සහ තිව්‍රතාවය මත තීරණය කිරීම

7.3. කලමනාකරණ සැලසුම නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පුහුණුවක් සේවකයන්ට ලබාදීම හා එය නිසි ආකාරයෙන් සුපරික්ෂණයට ලක් කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

7.3.1) ක්‍රියාවලියේ පරිමානයට සහ තීව්‍රතාවයට අනුව කලමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයන් (උප කොන්ත්‍රාත්කරුවන් සහ රබර් කිරි කපන්නන් ඇතුළුව) පුහුණු කළ ආකාරය පිළිබඳ වාර්තාවන්

7.3.2) කලමනාකරණ සැලසුම පිළිබඳව එක් එක් සේවකයන් පුහුණුව ලැබූ ආකාරය පිළිබඳව වාර්තාවන් නඩත්තු කිරීම

7.3.3) කලමනාකරණ සැලසුමට අනුකූලව කටයුතු කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තාවන් පෙන්වීමට හැකිවීම

7.3.4) කලමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීමේදී සුදුසුකම් ලත් කලමනාකරුවන් විසින් සේවකයන් සුපරීක්ෂා කිරීම සහ ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

7.3.4) ක්‍රියාවලියේ පරිමානයට සහ තීව්‍රතාවයට අනුව කලමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයන් (උප කොන්ත්‍රාත්කරුවන් සහ රබර් කිරි කපන්නන් ඇතුළුව) නිසි ආකාරයෙන් පුහුණු කර ඇත.

**7.3.1.** තොරතුරුවල රහස්‍යභාවයට ගරු කරන අතරම වන කලමනාකාරිත්වය විසින් කලමනාකරණ අංක 7.1 අඩංගු කරුණු ද සැලසුමේ මූලික අංගවල සංක්ෂිප්තයක් පොදු ජනතාවට ලබා ගැනීමට පහසුකම් සැලසිය යුතුය. **- මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැලකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

7.4.1) අංක 7.1 කරුණු ද ඇතුලත්ව මේ පිළිබඳව උනන්දුව දක්වන පාර්ශවකරුවන්ට කලමනාකරණ සැලසුමේ මූලික අංගවල තොරතුරු අඩංගු සංක්ෂිප්තයක් පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම.
7.4.2) මෙම සංක්ෂිප්තයට අදාල ක්‍රියාවලියේ පරිමානයට සහ තීව්‍රතාවයට අනුකූලවීම
7.4.3) සංක්ෂිප්තය කාලානුරූපීව හා ක්‍රියාවලියේ පරිමානය හා තීව්‍රතාවයට අනුකූලව යාවත්කාලීන කිරීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

7.4.4) උනන්දුව දක්වන පාර්ශවකරුවන්ට කලමනාකරණ සැලසුමේ මූලික අංගවල තොරතුරු අඩංගු සංක්ෂිප්තයක් පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම.

**නියාමන අංක 8: පසුවිපරම සහ තක්සේරුව (අගැයීම)**

වන කලමනාකරණ වැඩසටහනේ පරිමානයට සහ තීව්‍රතාවයට අනුරූපීව පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. එමගින් වන භූමියේ තත්වය, වන භූමියෙන් ලැබෙන නිපැයුම්වල ප්‍රමාණය, ආරක්ෂාකාරී දාමය( chain of custody) කලමනාකරණ ක්‍රියාවලිය සහ පාරිසරික සහ සමාජීය බලපෑම් තක්සේරුකිරීමට හැකිවේ.

8.1. පසුවිපරමේ පරිමානය සහ තිව්‍රතාවය තිරණය කළ යුත්තේ වන කලමනාකරණයේ පරිමානය සහ තිව්‍රතාවය මතය. එමෙන්ම වන කලමනාකරණ ක්‍රියාවලියේ සාපේක්ෂ සංකීර්ණත්වය සහ බලපාන පරිසර පද්ධතියේ දූර්වලතාවය ආදී කරුණුද මෙහිදී සැලකිල්ලට ගත යුතුවේ.

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

8.1.1) ක්‍රියාවලියේ පරිමානයට සහ තිව්‍රතාවයට අනුරූපිව වනයේ තත්වය කලමනාකරණ ක්‍රියාකාරකම් සැලසුමට අනුකූලවීම සහ ආරක්ෂක දාමය යන කරුණු පසුවිපරම් කිරිමේදී පිළිපැදිය යුතු ක්‍රියාපිළිවෙත කාල සැලසුම් ලිඛිතව සටහන් කළ යුතුය.

8.1.2) වන පරිපාලකයවරුන් විසින් මෙම පසුවිපරම් ක්‍රියාවලියේ දී අදාල ක්‍රියාපිළිවෙත අඛණ්ඩව පවත්වා ගෙන යාම පෙන්නුම් කිරිම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

8.1.3) ක්‍රියාවලියේ පරිමානයට සහ තිව්‍රතාවයට අනුරූපිව වනයේ තත්වය කලමනාකරණ ක්‍රියාකාරකම් සැලසුමට අනුකූලවීම සහ ආරක්ෂක දාමය යන කරුණු පසුවිපරම් කිරිමේදී පිළිපැදිය යුතු ක්‍රියාපිළිවෙත කාල සැලසුම් ලිඛිතව සටහන් කිරිම

8.2. වන කලමනාකාරිත්වයේදී පසුවිපරම් ක්‍රියාවලියට අදාලව පර්යේෂණ සහ දත්ත රැස් කිරිම අවශ්‍ය වන අතර අවම වශයෙන් පහත දැක්වෙන දර්ශක පවත්වාගෙන යා යුතුය.

a) සියලු වන ආශ්‍රිත නිෂ්පාදනවල අස්වැන්න ලබා ගත් ප්‍රමාණය.
b) වර්ධන ප්‍රමාණය ප්‍රතිරෝපනය සහ වන භූමියේ තත්ත්වය.
c) ශාක සහ සත්ත්ව විශේෂවල සංයුතිය සහ නිරික්ෂණය කළ වෙනස්කම්.
d) අස්වැන්න ලබා ගැනිම සහ වෙනත් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවිය හැකි සමාජ පාරිසරික බලපෑම්.
e) වන කලමනාකාරිත්වය ඇති කාර්යක්ෂමභාවය පිරිවැය හා ඵලදායිතාව

ක්‍රියාත්මක කිරිමට අදාල දර්ශක:

8.2.1) ඉහත ප්‍රමිතින් අදාල දර්ශක මත ක්‍රියාවලියේ පරිමානය සහ තිව්‍රතාවය අනුව වන පරිපාලකවරුන් විසින් නියමිත කාල පරිච්ඡේදයන්වලදී තොරතුරු රැස්කිරිම

8.2.2) ක්‍රියාවලියේ පරිමානය සහ තිව්‍රතාවයට අනුව වානිජ මට්ටමෙන් සිදු කරන එක් එක් වන නිෂ්පාදනවල අස්වැන්න පිළිබඳව වාර්ෂික හෝ කන්නයන් අනුව ලිඛිත වාර්තාවන් පවත්වාගෙන යා යුතුය.

*උදාහරණ:*

- *එක් එක් විශේෂයන්ට අනුව ලබාගත් දැව ප්‍රමාණය පිළිබඳ වාර්තාවන්*
- *රබර් කිරි හෝ පිටි නිෂ්පාදනය පිළිබඳ වාර්තාවන්*

8.2.3) වන පරිපාලකවරුන් විසින් නිෂ්පාදනයට පරිසරයට සහ සමාජ-ආර්ථිකයට අදාල ප්‍රධාන දර්ශකයන්හි තොරතුරු රැස්කිරීමට හා ඒවා භාවිතා කිරීමට ඇති කැපවීම පෙන්නුම් කිරීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

8.2.4) ක්‍රියාවලියේ පරිමානය සහ තීව්‍රතාවයට අනුකූලව වන කලමනාකරුවන් විසින් නියමිත කාලවකවානු අනුව තොරතුරු රැස්කිරීම.

8.2.5) කලමනාකරණ අරමුණු ළගාවී ඇතිදැයි තිරණය කිරීම පිණිස අවශ්‍ය තොරතුරු රැස්කිරීම සහ ලේඛනගත කිරීම. සියලු අවස්ථාවන්හිදී මේ සඳහා පහත කරුණු අඩංගු විය යුතුය

- එක් එක් විශේෂය අනුව වානිජමය වටිනාකමකින් යුත් වන ආශ්‍රිත නිෂ්පාදන සියල්ලෙන්ම ලත් අස්වැන්න.
- ප්‍රමිති අංක 6.1 අනුව හඳුනා ගත් ක්‍රියාවලියන් ගේ ප්‍රතිඵල
- ප්‍රමිති අංක 6.2 අනුව හඳුනාගත් වෙනස්කම්
- ප්‍රමිති අංක 9.1 හඳුනාගත් සංරක්ෂණ වටිනාකමින් වැඩි වන වගාවන්හි වාර්ෂික පසුවිපරම
- ආක්‍රමණික ආගන්තුක විශේෂ

*උදාහරණ:*

- *විශේෂ අනුව ලබා ගත් දැව ප්‍රමාණ පිළිබඳ වාර්තා*
- *රැස්කරගත් රබර් ප්‍රමාණය පිළිබඳ වාර්තා*

8.3. එක් එක් වන ආශ්‍රිත නිෂ්පාදනවල අත්පත් කර ගැනීමේ දාමය "chain of custody." යන ක්‍රියාවලිය ආරම්භයේ සිට හඳුනාගැනීම පිණිස එයට අදාල ලිපි ලේඛන වන පරිපාලකවරුන් විසින් පසුවිපරම් කිරීමේ සහ සහතික කිරීමේ ආයතනයන් වෙත ලබාදිය යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

8.3.1) වන කලමනාකරණ සහතික කිරීමේ ඇගයීම් සිදුකරන අවස්ථාවේ යම් ඉඩම්හිමියකු/පරිපාලකවරයකු විසින් සිය නිෂ්පාදනයක් මත FSC ලාංජනය සලකුණු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු විසින් අත්පත් කර ගැනීමේ දාමය "chain of custody."අවශ්‍යතා පිළිබඳ දැණුවත්විය යුතු අතර ලාංජනය භාවිතා කිරීමට ප්‍රථම ඒ සඳහා SCS වෙතින් පූර්ව අනුමැතියක් ඉල්ලා සිටිය යුතුය.

8.3.2) අත්පත් කර ගැනීමේ ක්‍රියාදාමයේදී නිෂ්පාදන තොග හා ඒවා කලමනාකරණය කරන ආකාරය පිළිබඳ ලිඛිතව පැහැදිලි කිරීම. උදාහරණයක් ලෙස සහතික ලත් වන භූමි ප්‍රදේශයකට අදාල දැව කොටන් සහතික නොලත් මූලාශ්‍රයකින් ලත් දැව කොටන් හා මිශ්‍ර නොවීම. මෙම අත්පත් කර ගැනීමේ දාමයට අදාල ක්‍රියාවලිය වර්තමාන FSC අවශ්‍යතාවන්ට අනුකූලවේ.

8.3.3) නිෂ්පාදන තොග හා ඒවා කළමනාකරණය පාලනය කිරීමේ ක්‍රියාවලියේදී ලිඛිත පැහැදිලි කිරීම් මගින් රබර් සහ දැව නොවන වෙනත් නිෂ්පාදන සහතික ලත් වන භූමි ප්‍රදේශයෙන් ලබාගත් බව තහවුරු කිරීම.

Comment [A1]: Shouldn't SLIMFs also meet the stump to gate COC requirement in the 2nd indicator?

8.4. පසුවිපරමේ ප්‍රතිඵල කළමනාකරණ සැලසුමේ ක්‍රියාත්මක කිරීමේ සහ සංශෝධනයන්ට ඇතුලත් විය යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

8.4.1) ක්‍රමානුකූලව සිදුකළ පසුවිපරම් ක්‍රියාවලියකින් ලත් තොරතුරු සංශෝධිත කළමනාකරණ සැලසුමට මෙන්ම සාමාන්‍යය මෙහෙයුම් ක්‍රියාවලියට ඇතුලත් කිරීමට වන පරිපාලකවරුන් සහ සැලසුම්කරුවන් ගේ කැපවීම හා ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන තිබීම ප්‍රමිති අංක 7.2 බලන්න.

8.4.2) කළමනාකරණ සැලසුම ක්‍රමයෙන් ගොඩනැංවීමේ දී සිදුකරන ලද සංශෝධනයන් තුළ පසුවිපරම් ක්‍රියාවලියේ ප්‍රතිඵල සුදුසු ආකාරයෙන් ඇතුලත් කර ඇති බව පෙන්නුම් කිරීම

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කළමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

8.4.3) ක්‍රමානුකූලව සිදුකළ පසුවිපරම් ක්‍රියාවලියකින් ලත් තොරතුරු සංශෝධිත කළමනාකරණ සැලසුමට මෙන්ම සාමාන්‍යය මෙහෙයුම් ක්‍රියාවලියට ඇතුලත් කිරීමට වන පරිපාලකවරුන් සහ සැලසුම්කරුවන් ගේ කැපවීම හා ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන තිබීම ප්‍රමිති අංක 7.2 බලන්න.

8.5 තොරතුරුවල රහස්‍යභාවයට ගරු කරන අතර වන කළමනාකාරිත්වය විසින් ප්‍රමිති අංක 8.2 ඇතුළුව පසුවිපරම් සඳහා භාවිතා කරන දර්ශකවල ප්‍රතිඵල උනන්දුවන පාර්ශවයන්ට ලබා ගැනීමට ඉඩකඩ සැලසිය යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

8.5.1) ප්‍රමිති අංක 8.2 හි දක්වා ඇති දර්ශකයන් ඇතුළුව විවිධ කාල පරිච්ඡේදයන්වල දී සිදු කරන ලද පසුවිපරම්වල ප්‍රතිඵල සංක්ෂිප්තයක් උනන්දුවන පාර්ශවකරුවන්ට පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම

8.5.2) පසුවිපරම් සංක්ෂිප්තය යාවත්කාලීන කර පවත්වාගෙනයාමට වන කළමනාකාරිත්වය පියවර ගැනීම

**නියාමන අංක 9. ඉහල සංරක්ෂිත වටිනාකමකින් HIGH CONSERVATION VALUE FORESTS (HCVF) යුත් වන භූමි නඩත්තු කිරීම**

කලමනාකරණ ක්‍රියාවලිය මගින් ඉහල සංරක්ෂිත වටිනාකමකින් යුත් වන භූමි (HCVF) එහි සංරක්ෂිත අගයන්ට හේතුවන ලක්ෂණ ඒ ආකාරයෙන්ම හෝ වැඩි දියුණුවන ආකාරයෙන් පවත්වාගෙන යාමට පියවර ගැනීම. ඉහල සංරක්ෂිත වටිනාකමක් ඇති වනභූමි පිළිබඳ තීරණ ගැනීමේදී එහි සුරක්ෂිතතාවය තහවුරු වන ආකාරය පිළිබඳ සැලකිල්ලට ගැනීම.

9.1 වන සංරක්ෂිතයේ වටිනාකම ඉහල අගයක් ගැනීමට පාදක වන විශේෂ ලක්ෂණ ඇති බව ඇගයීම තීරණය කිරීම සම්පූර්ණ වන්නේ වන කලමනාකරිත්වයේ පරිමානය සහ තීව්‍රතාවයට අනුකූලවය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

9.1.1) යම් වන භූමියක් තුළ ඉහල සංරක්ෂිත අගයකින් යුත් වන ප්‍රදේශයක් ඇති බව FSC මගින් නිර්වචනය කර ඇති ඉහල සංරක්ෂිත අගයකින් යුත් වන භූමියකට අවශ්‍ය නිර්ණායක සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තීරණය කිරීම .

9.1.2) අදාල පාර්ශවකරුවන් සහ බාහිර විශේෂඥ දැණුම ඇති පිරිස සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉහල සංරක්ෂිත අගයක් ඇති වන භූමි ප්‍රදේශයක් බව තීරණය කිරීම. වන භූමිය ඉහල සංරක්ෂිත අගයකින් යුක්තබව හඳුනාගැනීමට ජාතික මට්ටමින් භාවිතා කරන මෙවලම් national toolkit ආදිය තිබේ නම් ඒවා භාවිතා කිරීමෙන් අනතුරුව තීරණයන්ට එළඹීම.

9.1.3) වන භූමියක් ඉහල සංරක්ෂිත අගයක් ගැනීමේ දී අදාල සංකල්ප සහ නිර්වචනයන් පිළිබඳව වන පරිපාලකවරුන්ට පැහැදිලි අවබෝධයක් තිබීම සහ එම මූලධර්මයන්ට අනුකූලව ක්‍රියා කිරීමට ඔවුන් පියවර ගෙන තිබීම.

9.2. සහතික කිරීමේ ක්‍රියාවලියේ දී සාකච්ඡා කිරීමේ ක්‍රියාදාමයේදී සංරක්ෂණයට අදාලව හඳුනාගන්නා ලද වැදගත් ලක්ෂණ පිළිබඳ ඉස්මතු කර දක්වමින් ඒවා නඩත්තු කිරීමට ඇති විකල්ප ද සාකච්ඡා කල යුතුය.

.

සටහන මෙම ප්‍රමිතියේ දී වන කලමනාකාරණ ක්‍රියාවලිය නොව මූලික වශයෙන් සහතික කරන්නාගේ වගකීම කෙරෙහි අවධානය යොමු වෙයි.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

9.2.1) ඉහල සංරක්ෂිත අගයක් ඇති බව තීරණය කිරීමට අදාල සාකච්ඡාමය ක්‍රියාවලියට අදාල පාර්ශවකරුවන් පිළිබඳ ලැයිස්තුවක් SCS වෙත ලබාදීමට වන කලමනාකාරිත්වය පියවර ගැනීම

9.2.2) වන කළමනාකාරිත්වය විසින් ඉහළ සංරක්ෂිත අගයක් ඇති වන භූමි ආරක්ෂා කිරීමට නිරන්තරයෙන් පියවර ගන්නා බව පාර්ශවකරුවන් හා පැවති සාකච්ඡාවලින් පෙනියාම.

9.3. සංරක්ෂණයට අදාල විශේෂ ලක්ෂණ ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට හෝ වැඩි දියුණු කිරීමට ගන්නා විශේෂ පියවර කළමනාකරණ සැලසුමට ඇතුලත් කළ යුතුය. මෙම පියවරයන් විශේෂයෙන්ම පොදු පරිශීලනය සඳහා සකස් කරන ලද කළමනාකරණ සැලසුමේ සංක්ෂිප්තයට ඇතුලත් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

9.3.1) හඳුනාගන්නා ලද ඉහල අගයකින් යුත් සංරක්ෂිත එක් එක් භූමිය තුළ ඇති විශේෂ සංරක්ෂණ ලක්ෂණ කළමනාකරණ සැලසුමේ විස්තර කර දක්වා තිබීම.

9.3.2) ඉහල සංරක්ෂණ අගයක් ඇති වන භූමි ලෙස නම් කර ඇති ප්‍රදේශවල ඇති විශේෂ ලක්ෂණ එලෙස පවත්වාගෙන යාමට හෝ වැඩි දියුණු කිරීමට ගෙන ඇති විශේෂ ප්‍රතිපත්තිමය තීරණ කළමනාකරණ සැලසුමේ හා පාර්ශවකරුවන් සඳහා ඉදිරිපත් කර ඇති සංක්ෂිප්තයේ සඳහන්වීම හා ආරක්ෂක පියවර සහිත ප්‍රවේශයන්

9.4. සංරක්ෂණයට අදාල ගුණාත්මක ලක්ෂණ පවත්වාගෙන යාමට හෝ වැඩි දියුණු කිරීමට ගෙන ඇති පියවර තක්සේරු කිරීම පිණිස වාර්ෂිකව පසුවිපරම් සිදු කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

9.4.1) සඵලදායි බව මැණීම සඳහා අදාල දර්ශක ගොඩනැගීම සහ කළමනාකරණ සැලසුමේ ඉහල සංරක්ෂණ අගයක් ඇති වන භූමි සඳහා වූ කොටසට ඇතුලත් කිරීම

9.4.2) ක්‍රියාවලියේ පරිමානයට හා තීව්‍රතාවයට අනුරූපව ඉහල සංරක්ෂණ අගයක් ඇති වන භූමි කළමනාකරණයට සහ ආරක්ෂාවට ගෙන ඇති පියවර සහ සංරක්ෂණ අගය ඇති ලක්ෂණ නඩත්තුව සහ/හෝ වැඩි දියුණු කිරීමට ගෙන ඇති පියවරේ සඵලදායි බව ඇගයීම කේන්ද්‍රකර ගනිමින් වාර්ෂික පසුවිපරමක සිදු කිරීම.

9.4.3) එම පසුවිපරම් වැඩසටහනේ ප්‍රතිඵල අනුව කළමනාකරණ සැලසුම හා ආරක්ෂිත ප්‍රතිපත්තීන් සංශෝධනය හා ඒවා ක්‍රියාත්මක කිරීම.

**නියාමන අංක10: වන වගාවන් PLANTATIONS**

වන වගාවන් සැලසුම්කිරීම සහ කළමනාකරණය සිදුකළ යුත්තේ ප්‍රමිති අංක 1.9 සහ 10 සඳහන් කර ඇති මූලධර්මයන්ට අනුකූලවය. මෙම කර්මාන්ත මගින් සමාජ-ආර්ථික ප්‍රතිලාභ රාශියක් අතපත් කර දීමට හැකිවන අතර වන නිෂ්පාදනවලට ඇති ඉල්ලුම

සපුරාලීමට දායකවීමත් ස්වභාවික වනභූමි සංරක්ෂණය යළි ස්ථාපිත කිරීම සහ කළමනාකරණය පරිපූර්ණය කිරීමටත් දායක වනු ඇත.

10.1. ස්වභාවික වනභූමි සංරක්ෂණය සහ යළි ස්ථාපිත කිරීමේ අරමුණු ඇතුළුව වන වගාවේ අරමුණු කළමනාකරණ සැලසුමේ පැහැදිලිව දක්වා තිබීම සහ සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී එම අරමුණු කරා යොමුව ඇති බව තහවුරු කිරීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.1.1) යම් වන වගාවකට අදාල වන භූමිය සඳහා කළමනාකරණ සැලසුමේ භූමිය අයිතිකරු හා/හෝ වන වගාවේ අයිතිකරු ගේ අරමුණු ඇතුලත්වීම.

10.1.2) හානියට පත්ව ඇති ස්වභාවික වන භූමි යළි ස්ථාපනය කිරීම සහ ස්වභාවික වන භූමි සංරක්ෂණයට ප්‍රතිපත්ති වැවිලි කර්මාන්තයට අදාල වන භූමිය සඳහා වූ අරමුණුවලට ඇතුලත් වීම.

10.1.3) වන වගාව සහිත වන භූමි කළමනාකරුවන් විසින් කළමනාකරණ සැලසුම ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන බව තහවුරු කිරීම

10.2. වන වගාව සැලසුම් කිරීමේ කාර්යයයේදී ස්වභාවික වන භූමි යළි ස්ථාපනය කිරීම සහ සංරක්ෂණය ප්‍රවර්ධනය කළ යුතු අතර එමගින් මෙම වනභූමිවලට අහිතකර බලපෑම් ඇති කිරීම සතුන් ගේ ස්වභාවික ගමන් මාර්ගයන් අවහිර කිරීම ආදිය සිදු නොකළ යුතුය. ජලය ගලා යන කලාපයන් මෙන්ම එක් එක් වයස් කාණ්ඩයන්ට අයිති ශාක සහ ඒවයේ චක්‍රානුකූල කාල පරිච්ඡේදයන් rotation periods ආදි කරුණු වැවිලි කර්මාන්තය සැලසුම් කිරීමේ දී ක්‍රියාවලියේ පරිමානය හා තීව්‍රතාවය අනුව උපයෝගී කර ගත යුතුය. වැවිලි කර්මාන්තය සිදුකළ යුතු ඉඩම් කට්ටි වන භූමියේ ස්වභාවික භූමි රටා හා අනුරූප විය යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.2.1) වන වගාව සිදු කිරීමේදී එය සිදුකරන භූමියේ ස්වභාවික භූමි රටාවන් සහ අනෙකුත් රටාවන්ට අනුරූපි වීම.

10.2.2) ගලා යන ජල පහර සඳහා අවරෝධක කලාපයන් ස්ථාපනය කිරීම Streamside buffer zones ඒ තුළ ස්වභාවික ගස්වැල් ආවරණය නඩත්තු කිරීම හෝ ස්ථාපිත කිරීම. මෙම අවරෝධක භූමි කලාපයේ පළල ප්‍රදේශයේ එවැනි ස්ථාන සඳහා සාමාන්‍යයෙන් භාවිතා කරන ප්‍රමාණය හා සමානවීම හෝ එය ඉක්මවා යෑම.

10.2.3) ක්‍රියාවලියේ පරිමානය සහ තීව්‍රතාවයට අනුරූපීව සතුන් ගමන් ගන්නා ස්වභාවික මාර්ගයන් ඔස්සේ ගස්වැල් වැවීමට සැලැස්වීම.

10.2.4) වන වගා කර්මාන්තය සැලසුම් කිරීමේ දී වගාවේ වයස් කාණ්ඩයන් age classes සහ කාල පරිච්ඡේද චක්‍රයන් rotation periods අනුව විවිධත්වය සැලකිල්ලට ගැනීම.

10.3. වන වගාවේ දී ආර්ථික හා සමාජීය මෙන්ම ජීවි පද්ධතිවල ස්ථාවරත්වය වර්ධනය කිරීමට අදාලව වගාව තුළ විවිධත්වයෙන් යුත් සංයුතියක් ඇති කිරීම යෝග්‍යවේ. එහිදී කලමනාකරණ ඒකකවල ප්‍රමාණය සහ අදාල භූමි පිහිටි ආකාරය (රටාව) ජාන අනුව විශේෂවල සංයුතිය හා ප්‍රමාණය, වයස කාණ්ඩය සහ ව්‍යුහය වැනි කරුණු පදනම්ව මෙම සංයුතිය සකස් කිරීමට පියවර ගැනීම

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.3.1) වන වගා වැඩසටහන සඳහා විශේෂ කිපයක් හෝ සම්භවයන් provenances කීපයක් ඇතුලත් කිරීමට පියවර ගැනීම

10.3.2) කලමනාකරණ කාල පරිච්ඡේදය තුළදී පළපුරුද්ද අනුව විවිධත්වය හඳුන්වාදීමට පියවර ගැනීම:. ශාක වර්ග මාරු කිරීම විවිධ ප්‍රමාණ සහ හැඩරුව අනුව කඳන් කැපීම සිදු කිරීම සහ වගාව තුළ ස්වේච්ඡාවෙන් ශාක රෝපනයවීමට ඉඩ හැරීම සහ ඒවා නඩත්තු කිරීම

10.3.3) වන වගා කලමනාකරණ සැලසුමේ ජෛව විවිධත්වය සඳහා අදාල ප්‍රතිපත්ති සහ උපදේශ ඇතුලත් කර තිබීම.

10.4. රෝපනය කිරීම සඳහා ශාක විශේෂ තෝරා ගැනීමේ දී ඒවා අදාල පරිශ්‍රයට සම්පූර්ණ වශයෙන් යෝග්‍යවීම සහ කලමනාකරණ අරමුණුවලට අනුකූලවීම යන කරුණු මත පදනම් විය යුතුය. වන වන වගාවේ දී මෙන්ම හානියට පත්වූ සංරක්ෂිත වන භූමි යළි ස්ථාපිත කිරීමට හා පවත්නා වන භූමිය සංරක්ෂණයේදී ජීව විද්‍යාත්මක විවිධත්වය පවත්වා ගැනීම පිණිස ආගන්තුක විශේෂයන්ට වඩා සම්ප්‍රදායික විශේෂයන්ට ප්‍රමුඛතාවය දැක්වීම. ආගන්තුක විශේෂ භාවිතා කළ යුත්තේ එම විශේෂ සම්ප්‍රදායික විශේෂයන්ට වඩා යෝග්‍ය බව තහවුරු කිරීම. එමනේම අස්වාභාවික ලෙස ශාක මිය යාම රෝගවලට ගොදුරුවීම හෝ කෘමි විශේෂ බෝවීම සහ ජීව විද්‍යාත්මක ලෙස අහිතකර බලපෑම් ආදි කරුණු ප්‍රවේශමෙන් පසුවිපරම් කළ යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.4.1) සම්ප්‍රදායික විශේෂයන් නිසි ඇගයීමකට ලක් කිරීමෙන් අනතුරුව ආගන්තුක විශේෂයන් රෝපනය කළ කිරීම හා එහිදී සම්ප්‍රදායික විශේෂ මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි බව තහවුරු වීම.

10.4.2) ආගන්තුක විශේෂයන් අදාල භූමි ප්‍රදේශයට යෝග්‍ය බව තහවුරු කර ගැනීමට නියමිත කාල අන්තරයන් තුළදී පසුවිපරම් කිරීම. මෙහිදී පැල මිය යාම රෝග හා කෘමි උවදුර පැතිරීම වැනි කරුණු විමසිල්ලට ලක් කිරීම.

10.4.3)

ශාක සම්භවයන් හා විශේෂ තෝරා ගැනීමේ දී ඒවා අදාල භූමි ප්‍රදේශයට සහ කලමනාකරණ අරමුණුවලට යෝග්‍ය බවට සිදුකල අත්හදා බැලීම් ලිඛිත වශයෙන් තහවුරු කර තිබීම

10.4.4) වගාවන් සඳහා ලබා ගන්නා ලද බීජ හෝ පැල ලබා ගන්නා මූලාශ්‍රයන් පිළිබඳ තොරතුරු කලමනාකරණ සැලසුමේ හෝ වෙනත් සුදුසු ලේඛනයක ඇතුලත් කිරීම.

10.5. වන කළමනාකරණයට අදාල සම්පූර්ණ ප්‍රදේශයෙන් වගාවට යටත් වන ප්‍රදේශය ස්වභාවික වන ආවරණයක් මෙන් ස්ථාපිත කර කලමනාකරණය කිරීම.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.5.1) දැනට පවතින ස්වභාවික ජීවී පද්ධතිය නියෝජනය වන සාම්පලයක් එම ස්වාභාවික ආකාරයෙන්ම අදාල ප්‍රදේශයේ හෝ ඉන් බාහිර ස්ථානයක ආරක්ෂා කිරීම හේ ප්‍රතිස්ථාපනය කිරීම

10.5.2) ස්වභාවික වන ආවරණය සඳහා කැපකර ඇති භූමියේ ප්‍රතිශතය එලෙස සාමාන්‍යයෙන් වෙන් කරන භූමි ප්‍රමාණය ඉක්මවා යාම.

10.5.3) වන කළමනාකරණ ඒකකය තුළ ඇති ස්වභාවික වන භූමි ප්‍රදේශය හෝ ස්වභාවික වන ආවරණය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පරිදි සිතියම් ගත කිරීම

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි:

10.5.4) වන වගාවේ ජීවී පද්ධතියේ වටිනාකම වැඩි දියුණු කිරීමට ගන්නා ලද පියවර එහි සංරක්ෂණය කිරීමේ ලක්ෂණයන්ට අනුරූපවීම.

10.5.5) කුඩා වන වගාවන්ට ජීව විද්‍යාත්මකව හෝ ආර්ථික වශයෙන් සංරක්ෂිත භූමියක් ලෙස පවත්වාගෙන යාම අපහසු අවස්ථාවන්හිදී වන කලමනාකාරිත්වය විසින් එවැනි භූමි රටාවක් හෝ ජීවී පද්ධතියක් ඇති ස්ථානයක කලමනාකරණයට හා/හෝ එවැනි පද්ධතියක් යළි ස්ථාපිත කිරීමට එවැනි සමාන ආකාරයේ කුඩා පරිමානයේ ව්‍යාපෘති හා ඒකා බද්ධව දායක වූ බව පෙන්වීම.

10.6. පසේ ව්‍යුහය සාරවත්බව සහ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට හෝ වැඩි දියුණු කිරීමට පියවර ගැනීම. අස්වැන්න ලබා ගැනීමේ තාක්ෂණයන් මාර්ග සහ අඩිපාර සැකසීම සහ නඩත්තුව සහ ශාක විශේෂ තෝරා ගැනීමේදී එම ක්‍රියාකාරකම් හේතුවෙන් පසේ සාරවත් බව දිගුකාලීන වශයෙන් ක්ෂයවීමට (හානි පැමිණීමට) හෝ ජලයට ගුණාත්මකබවට හා ප්‍රමාණයට අහිතකර බලපෑම් ඇතිවීම වැනි තත්වයන් ඇති නොවිය යුතුය. එමෙන්ම ජලපවහන රටාවන් ද සැලකිය යුතු ලෙස වෙනස්වීම වැනි ලක්ෂණ ඇති නොවීමට පියවර ගත යුතුය.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.6.1) වන වගාවන් කලමනාකරණය කරනු ලබන පිරිස ක්ෂේත්‍ර පර්යේෂණයන්හි ක්‍රියාකාරී ලෙස නිරතවීම හා ක්ෂේත්‍ර ක්‍රියාවලියන්හි නියැලෙන අවස්ථාවන්හිදී අදාල වනභූමි ප්‍රදේශයේ ඇති පසේ ඵලදායිත්වය සහ ලක්ෂණ සැලකිල්ලට ගැනීම හා සිතියම් ගත කිරීම

10.6.2) වන භූමි වගා කිරීමේදී රුකබලා ගැනීමේ දී සහ අවසන් අස්වැන්න ලබා ගැනීමේදී පසේ සරුබවට සහ ඵලදායිත්වයට හානි නොවන ලෙස එම කාර්යයන් ඉටු කිරීමට පියවර ගැනීම

10.6.3) පරිශ්‍රයට යම් බලපෑම් ඇතිවන ක්‍රියාකාරකම්වලදී එය ජලජ ජීවින්ට හා එයට අදාල සම්පත් ආදියට ජලයේ ගුණාත්මකබවට  අහිතකර බලපෑම් ඇති නොවන බව තහවුරු කරගත යුතුය. එමෙන්ම පරිශ්‍රයේ ජල විද්‍යාත්මක ලක්ෂණවලට සැලකිය යුතු බලපෑමක් ඇති නොවීමට වග බලා ගතයුතුය. වන වගා කිරීම් සිදු කළයුත්තේ සමතලා මතුපිට හෝ සුළු වශයෙන් බෑවුම් ඇති භූමියක පමණි.

10.6.4) අදාල භූමියේ පිහිටි සියලූ ජල මාර්ග (ඇලදොල) හඳුනාගෙන සිතියම් ගත කිරීම

10.6.5) පස නිසි ආකාරයෙන් නඩත්තු කිරීමට සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාල ප්‍රතිපත්ති සහ උපදෙස් කළමනාකරණ සැලසුමට ඇතුලත්වීම.

10.7. කෘමින් සහ විවිධ රෝග ආක්‍රමණික ශාක බෝවීමෙන් සහ ගින්දර ආදියෙන් වනභූමියට හානි පැමිණීම වැලැක්වීමට හෝ අවම කිරීමට පියවර ගැනීම.  වසංගත කෘමි හා රෝග බෝවීම වැලැක්වීම හා කලමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙලක් සකස් කර කලමනාකරණ සැලසුමට ඇතුලත් කළ යුතුය.  එහිදී රසායනික කෘමිනාශක සහ පොහොර භාවිතයට වඩා ජීව විද්‍යාත්මක පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කළයුතුවේ. වන කලමනාකාරිත්වය පැල තවාන් ඇතුළු වගාවන්ට කෘෂි රාසායන සහ රසායනික පොහොර භාවිතා කිරීමෙන් ඉවත්වීමට පියවර ගත යුතුය.   රසායන පොහොර භාවිතය පිළිබඳව ප්‍රමිති 6.6 සහ 6.7

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.7.1) වන වගාවන් සඳහා අදාල තත්වයන්ට අනුකූලව හානිදායක කෘමීන් සහ රෝග කාරක වගාව මැරියාම සහ ආගන්තුක ආක්‍රමණශීලි ශාක පැතිරීම ආදී කරුණු පසුවිපරම් කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග

10.7.2) ක්‍රියාකාරී සැලසුමේ වසංගත කෘමි සහ රෝග ආදිය මැඩලීමට අදාල උපදෙස් අඩංගුවීම සහ ඒවා ක්ෂේත්‍රයේදී භාවිතා කර ඇති බව තහවුරු කිරීම.

10.7.3) වන පරිපාලකවරුන් විසින් ඔවුන් ගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවන් තුලින් රසායනික කෘමි නාශක සහ පොහොර වර්ග භාවිතය ක්‍රමයෙන් අඩු කරමින් සිටින බව තහවුරු කිරීම.

10.7.4) ක්‍රියාවලියේ පරිමානය සහ තීව්‍රතාවයට පදනම්ව ගිනි ගැනීම් වැලැක්වීමේ හෝ මැඩපැවැත්වීමේ සැලසුමක් පවත්වාගත යුෑම.

10.8 ක්‍රියාවලියේ පරිමානය සහ විවිධත්වයට අනුරූපව පසුවිපරම් ක්‍රියාවලියේදී සමාජ සහ ජීවි පද්ධතීන්ට ඇතිවන බලපෑම් නිරන්තරයෙන්ම තක්සේරුවට ලක් කිරීම (උදා - ශාක විශේෂවල ස්වභාවික ප්‍රතිරෝපනය ජල සම්පතට ඇති බලපෑම් සහ පසේ සරුබව මෙන්ම ප්‍රජාවේ සුභසාධනය සහ යහපැවැත්ම වැනි කරුණු) මීට අමතරව අංක 8 6 සහ 4 ඇතුලත් වූ කරුණු කෙරෙහිද අවධානය යොමුවීම. කිසිම විශේෂයක් මහා පරිමානයෙන් වගා කිරීමට පෙර එම විශේෂය

අදාල වන භූමියේ ජීවි පද්ධතියට මනා ලෙස ගැලපීම ජීවි පද්ධතියට සැලකිය හැකි ආකාරයෙන් අහිතකර බලපෑම් ඇති නොකිරීම ආක්‍රමණශීලි නොවීම වැනි කරුණු ඒ පිළිබඳ පෙර ලබා ගත් අත්දැකීම් ආදියෙන් හෝ නියැදියක් වගා කිරීම මගින් තහවුරු කර ගත යුතුය. වන වගාවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී සමාජ ගැටළු කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය. විශේෂයෙන්ම ප්‍රජාවගේ අයිතියට භාවිතයට හා වනභූමියට පිවිසීමට ඇති අයිතිය වැනි කරුණු කෙරෙහි මෙහිදී අවධානය යොමු කළ යුතුවේ.

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.8.1) පසුවිපරම් ක්‍රියාවලියට වන වගා හේතුවෙන් ජීවි පද්ධතිවලට සහ සමාජීය වශයෙන් සිදුවන බලපෑම් ඇතුලත් විය යුතුය ප්‍රමිති අංක 4.4 සහ 8.2 බලන්න.

10.8.2) වගා කර ඇති විශේෂ හේතුවෙන් භූමි රටාවන්ට සිදුවන බලපෑම් වැනි පරිශ්‍රයට on-site හා ඉන් බාහිරව off-site සිදුවිය හැකි බලපෑම් පසුවිපරම් ක්‍රියාවලියට කේන්ද්‍රවීම. .

10.8.3) වගා කිරීමට යෝග්‍ය විශේෂයන් තෝරාගන්නේ ප්‍රාදේශිය වශයෙන් අත්හදා බැලීම් සිදු කර සහ එවැනි විශේෂ යෝග්‍ය බව අත්දැකීම් මගින් සනාථ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුවය.

10.8.4) වන වගාවක් ලෙස වන භූමියක් සකස් කිරීමට අදාල භූමි අත්පත් කිරීමේදී එම භූමියේ හිමිකාරිත්වය ඇති පාර්ශවයන්ට නියමිත වන්දි මුදල් ලබාදීමෙන් අනතුරුව සිදු කිරීම. එමෙන්ම මෙම ක්‍රියාව හේතුවෙන් භූමියට පිවිසීමට/ භාවිතා කිරීමට අවට ප්‍රජාවට ඇති අයිතියට අහිතකර බලපෑම් නොකිරීම.

SLIMF අවශ්‍යතාවන්ට අනුව වන කලමනාකරණ ඒකකයට FMU පහත දැක්වෙන දර්ශක පමණක් අදාලවන අතර මෙම දර්ශක SLIMF නොවන කාර්යයන් සඳහා භාවිතා නොකරනු ලබයි

10.8.5) පසුවිපරම් ක්‍රියාවලියට වන වගාවේ ක්‍රියාකාරකම් හේතුවෙන් ජීවි පද්ධතිවලට සහ සමාජීය වශයෙන් සිදුවන බලපෑම් ඇතුලත්වීම. ප්‍රමිති අංක 4.4 සහ 8.2 බලන්න.

**10.8.1** 1994 නොවැම්බර් මාසයෙන් පසුව ස්වභාවික වන භූමි වන වගාවන් ලෙස පරිවර්තනය කර ඇති අවස්ථාවන්හිදී ඒවා මෙම සහතික කිරීමේ ක්‍රියාවලියට සුදුසුකම් නොලබයි. එහිදී පරිපාලකවරු/අයිතිකරු විසින් මෙම පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියට ඍජුව හෝ වක්‍රාකාර ආකාරයෙන් වගකීමක් නොදරන බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහතික කිරීමේ ආයතනය වෙත ලබාදීම මගින් සුදුසුකම් ලබා ගත හැකිවේ. **- මේ නියාමනයන්ට අනුකූල නොවීම බැරෑරුම් ලෙස සලකන අතර නිසි ලෙස නිවැරදි කරන තෙක් සහතිකය ලබාදීමෙන් වැළකී සිටිනු ඇත.**

ක්‍රියාත්මක කිරීමට අදාල දර්ශක:

10.9.1) 1994 නොවැම්බර් සිට ස්වභාවික වන භූමිය සංරක්ෂණය කර ඇති බව තීරණය කිරීමට ප්‍රමාණවත් වාර්තා සහ සවිස්තරාත්මක තොරතුරු සහතික කිරීමේ විගණක නිලධාරින්ට සැපයීමට පියවර ගැනීම.

10.9.2) එවැනි යම් පරිවර්තනයක් කර ඇත්නම් එය සිදු කර ඇත්තේ වර්තමාන පරිපාලක/අයිතිකරුගේ අවශ්‍යතාව අනුව නොවන බව

**ඇමුණුම 1. ශ්‍රී ලංකාවේ වන රෝපණය සහ කලමනාකරණයට අදාල අණපනත් සහ රෙගුලාසි**

- ජාතික පාරිසරික පනත Act, 1980
- ජාතික පාරිසරික රෙගුලාසි (සංරක්ෂණය සහ තත්ත්ව) 1990
- සත්ත්ව සහ ශාඛ සංරක්ෂණ ආඥා පනත 1993
- **1980** අංක **33** දරණ කෘමිනාශක පාලන පනත
- රබර් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික උපදේශක මාලාව
- වන සංරක්ෂණ ආඥා පනත 1988
- කම්කරු සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ උපදේශ - ශ්‍රී ලංකා වෘත්තිය සංගමය
- රබර් කර්මාන්තය සඳහා වන උපදෙස් මාලාව මධ්‍යම පරිසර අධිකාරිය
- ශ්‍රී ලංකවේ කම්කරු නීතිය

**ඇමුණුම 2. බහුපාර්ශවික පාරිසරික එකගතා සහ ලෝක කම්කරු සංවිධානයේ සම්මුතීන්**

**බහුපාර්ශවික පාරිසරික එකගතා Multilateral Environmental Agreements:**

- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව සහ ශාක විශේෂ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (CITES) - 1979
- ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය - 1994 - ජෛව විවිධත්වය පිළිබඳ කාර්ටජිනා සම්මුතිය - 2004
- කාලගුණ විපර්යාස පිළිබඳ එක්සත්ජාතීන් ගේ වැඩපිළවෙල - 1993 කියෝතෝ සම්මුතිය 2004
- කාබනික දූෂක මැඩලීමේ ස්ටොක්හෝම් සම්මුතිය -2005
- රබර් නිෂ්පාදිත රටවල සම්මේලනයේ එකමුතුව - 1970 අත්සන් තබන ලදී

**Ratified ILO Conventions:**

| Convention | Ratification date | Status |
|---|---|---|
| C8 Unemployment Indemnity (Shipwreck) Convention, 1920 | 25:04:1951 | ratified |
| C11 Right of Association (Agriculture) Convention, 1921 | 25:08:1952 | ratified |
| C16 Medical Examination of Young Persons (Sea) Convention, 1921 | 25:04:1951 | ratified |
| C18 Workmen's Compensation (Occupational Diseases) Convention, 1925 | 17:05:1952 | ratified |
| C26 Minimum Wage-Fixing Machinery Convention, 1928 | 09:06:1971 | ratified |
| C29 Forced Labour Convention, 1930 | 05:04:1950 | ratified |
| C45 Underground Work (Women) Convention, 1935 | 20:12:1950 | ratified |
| C58 Minimum Age (Sea) Convention (Revised), 1936 | 18:05:1959 | ratified |
| C80 Final Articles Revision Convention, 1946 | 19:09:1950 | ratified |
| C81 Labour Inspection Convention, 1947 | 03:04:1956 | ratified |
| C87 Freedom of Association and Protection of the Right to Organise Convention, 1948 | 15:09:1995 | ratified |
| C90 Night Work of Young Persons (Industry) Convention (Revised), 1948 | 18:05:1959 | ratified |
| C95 Protection of Wages Convention, 1949 | 27:10:1983 | ratified |

| | | |
|---|---|---|
| C96 Fee-Charging Employment Agencies Convention (Revised), 1949 | 30:04:1958 | ratified |
| C98 Right to Organise and Collective Bargaining Convention, 1949 | 13:12:1972 | ratified |
| C99 Minimum Wage Fixing Machinery (Agriculture) Convention, 1951 | 05:04:1954 | ratified |
| C100 Equal Remuneration Convention, 1951 | 01:04:1993 | ratified |
| C103 Maternity Protection Convention (Revised), 1952 | 01:04:1993 | ratified |
| C105 Abolition of Forced Labour Convention, 1957 | 07:01:2003 | ratified |
| C106 Weekly Rest (Commerce and Offices) Convention, 1957 | 27:10:1983 | ratified |
| C108 Seafarers' Identity Documents Convention, 1958 | 24:11:1995 | ratified |
| C110 Plantations Convention, 1958 | 24:04:1995 | ratified |
| C111 Discrimination (Employment and Occupation) Convention, 1958 | 27:11:1998 | ratified |
| C115 Radiation Protection Convention, 1960 | 18:06:1986 | ratified |
| C116 Final Articles Revision Convention, 1961 | 26:04:1974 | ratified |
| C131 Minimum Wage Fixing Convention, 1970 | 17:03:1975 | ratified |
| C135 Workers' Representatives Convention, 1971 | 16:11:1976 | ratified |
| C138 Minimum Age Convention, 1973 | 11:02:2000 | ratified |
| C144 Tripartite Consultation (International Labour Standards) Convention, 1976 | 17:03:1994 | ratified |
| C160 Labour Statistics Convention, 1985 | 01:04:1993 | ratified |
| C182 Worst Forms of Child Labour Convention, 1999 | 01:03:2001 | ratified |

**ඇමුණුම 3.	වඳවීයාමට ලක්ව ඇති විශේෂ**

ශ්‍රී ලංකාවට අදාල වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන අන්තර්ජාල වෙබ් අඩවියේ දත්ත මූලයට පිවිසෙන්න

http://www.cites.org/eng/resources/species.html

**ඇමුණුම 4. පාරිභාෂික පද මාලාව**

**ජෛව විවිධත්වය**: සියලු මූලාශ්‍රවල පවතින ජීවී පද්ධතිවල විවිධත්වය. මෙයට ජලජ ගොඩබිම් සාගර සහ වෙනත් ජල ආශ්‍රිත ජීවී පද්ධති හා ජීවී සංකීර්ණ අයත්වේ. එමෙන්ම විශේෂතුළ පවතින හා විශේෂ අතර පවතින විවිධත්වය මෙන්ම ජීවී පද්ධති තුළ හා ජීවී පද්ධති අතර ඇති විවිධත්වය ද මෙයට අයත්වේ.

**ජෛව විවිධත්වයේ අගනාකම්**: නෛසර්ගික ජීවී ජානමය සමාජ ආර්ථික විද්‍යාත්මක අධ්‍යාපනික සංස්කෘතික විනෝදාංශ සහ දර්ශනිය යන ලක්ෂණවලට අදාල වටිනාකම් ජෛව විවිධත්වයට හා එහි අංගවලට ඇතුලත්වීම.

**ජීව විද්‍යාත්මක පාලනයන්**: එක් ජීවී පද්ධතියක් හෝ ගහණයක් පාලනය කිරීම සඳහා භාවිතා කරනු ලබන තවත් ජීවී පද්ධතියක් හෝ ජීවී ගහණයක්.

**අත්පත් කර ගැනීමේ දාමය Chain of custody**: වන භූමියට අදාල නිෂ්පාදනයන් ආරම්භ කිරීමේ ස්ථානයේ සිට එය අවසන් භාවිතා කිරීම දක්වා වන බෙදීයාමේ දාමය .

**රසායන ද්‍රව්‍ය**: වන කලමනාකරණ ක්‍රියාවලියේ දී භාවිතා කරන පොහොර කෘමි නාශක දිලීර නාශක සහ හෝමෝන වර්ග.

**සම්ප්‍රදායික අයිතිය**: දිගු කාලයක් පුරුද්දක් හෝ සම්ප්‍රදායක් ලෙස අඛණ්ඩව සිදුකළ ක්‍රියා හේතුවෙන් නීතියක් ලෙස භූගෝලීය හෝ සමාජ ඒකකයක් ලෙස ස්ථාපිතව ඇති අයිතිවාසිකම්.

**ජීවී පද්ධති**: එකිනෙක මත යැපෙන සියලු ශාක සහ සත්ත්ව විශේෂයන් සහ එහි භෞතික පරිසරය.

**වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ**: යම් ශාක හෝ සත්ත්ව විශේෂයක් මුළුමනින්ම හෝ යම් කොටසක් වඳවීමේ තර්ජනයට ලක්වීම.

**ආගන්තුක විශේෂ**: යම් ප්‍රදේශයකට ආවේනික නොවන හඳුන්වාදී ඇති ආගන්තුක සත්ත්ව හෝ ශාක විශේෂ.

**වන භූමියේ ඒකාබද්ධතාවය**: ස්වභාවික වන භූමියක ඇති සංයුතිය, ගතිකත්වය, (වෙනස්වීම්) ක්‍රියාකාරිත්වය සහ ව්‍යුහාත්මක ලක්ෂණ.

**වන කලමනාකාරණය/පරිපාලකවරු**: වන සම්පත් මෙන්ම එහි කලමනාකරණ ක්‍රම සහ ව්‍යුහයට ද සැලසුම් සහ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා වගකීම දරන පුද්ගලයන්.

**ජානමය වෙනස්කම්වලට ලක් වූ ජීවී විශේෂ**: ජානමය වශයෙන් ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම පිණිස විවිධ ක්‍රම මගින් උද්දීපනය induced කරන ලද ජීවී විශේෂ.

**පාරම්පරික භූමි හා කලාපයන්**: යම් ප්‍රජා කොට්ඨාශයකට පාරම්පරික ලෙස අයිති හෝ වෙනත් ආකාරයකින් පදිංචිව සිටි හෝ භාවිතා කරන ලද සම්පූර්ණ පරිසරය එනම් භූමිය, වාතය, ජලය, සාගරය, ශාක, සත්ත්ව විශේෂ සහ අනෙකුකත් සම්පත්

**පාරම්පරික ප්‍රජාව:** ආගන්තුක සංස්කෘතියකට හෝ වාර්ගිකත්වයකට අයත් ජන කොට්ඨාශයක් අදාල භූගෝලීය කලාපයට පැමිණෙන අවස්ථාවේදී එහි ජීවත් වූ ජන කොට්ඨාශයෙන් පැවත එන ප්‍රජාව. මෙම ආගන්තුක ජන කොට්ඨශය පැමිණ පෙර සිට ජීවත් වූ ප්‍රජාව ගේ භූමිය අල්ලා ගැනීම පදිංචිවීම හෝ අන් හේතුවක් නිසා කලින් සිට ප්‍රජාව සංඛ්‍යාත්මක ලෙස හීනවීම හේතුවෙන් ඔවුන් උප සංස්කෘතියක් බවට පත්වී ඇත.

**ඉහල අගයකින් යුක්ත සංරක්ෂිත වන භූමි:**
පහත දැක්වෙන ලක්ෂණවලින් එකක් හෝ කීපයක් සතුවීම

a. ගෝලීය වශයෙන් කලාපීය වශයෙන් හෝ ජාතික වශයෙන් වැදගත් කමක් ඇති ජෛව විවිධත්වයකින් යුත් වන භූමියක් (උදා ආවේනික, වඳවීයාමට ලක්වූ, සංරක්ෂණය කළ) මෙම විශේෂ වන කලාපය කළමනාකරණයට ලක්වූ සම්පූර්ණ භූමියම හෝ කලමනාකරණය කරන භූමිය තුළ ඒකකයක් වශයෙන් හෝ පිහිටිය හැකිය. මෙම භූමිය තුළ මෙම ශාක හෝ සත්ව විශේෂ සම්පූර්ණයෙන්ම හෝ සැලකිය යුතු මට්ටමකින් ස්වභාවික අන්දමින් පුළුල් ලෙස පැතිර සිටීම.
b. දුර්ලභ හා වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ව විශේෂ ජීවත්වන වනභූමි කලාප
c. ස්වභාවධර්මයට අවශ්‍ය මූලික ඉතා වැදලත් සේවාවන් ලබාදෙන වන භූමි ප්‍රදේශ (ජලධාරා හා මූලාශ්‍ර ආරක්ෂා කිරීම පාංශු ඛාදනය වැලැක්වීම)
d. ප්‍රාදේශිය ජනතාව ගේ මූලික අවශ්‍යතා සපුරාලන වන භූමි (උදා - එදිනෙදා යැපීම සෞඛ්‍ය) සහ/හෝ ප්‍රාදේශිය ජනතාවට සංස්කෘතිකමය වශයෙන් ඉතාමත් වැදගත් වන (මෙම ප්‍රජවේ ද සහාය ඇතිව හඳුනාගන්නා ලද සංස්කෘතික ආර්ථික සමාජ හෝ ආගමික වශයෙන) කලාප

**භූමි රටාවන්**: භූමියේ පිහිටීම, පස, දේශගුණය, ජීව විද්‍යාත්මක හේතු හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එකිනෙක හා අන්තර්ක්‍රියාවන් සිදු කරන ජීවි පද්ධති, පිහිටි ප්‍රදේශ

**ප්‍රාදේශිය නීති**: මධ්‍යම රජයේ නොවන වෙනත් ආයතන එනම් දෙපාර්තමේන්තු පළාත් පාලන ආයතන හෝ සම්ප්‍රදායික ප්‍රමිති ආදිය මත පදනම්ව ඇති නීතිරීති.

**දිගු කාලීන:** වනභූමිය හිමිකාරිත්වය හෝ කලමනාකරිත්වය දරණ පාර්ශවයන් විසින් කලමනාකරණ සැලැස්මේ අරමුණු, ලබා ගැනීමට අපේක්ෂිත අස්වැන්න සහ ස්ථාවර වන ආවරණ නඩත්තු කිරීමට කැපවීම යන කරුණු මත පදනම්ව තීරණය කරනු ලබන කාලවකවානුව. මෙම කාල වකවානුවේ දීර්ඝත්වය ජීවි පද්ධතියේ තත්වය අනුව තීරණය වන අතර එහිදී යම් ජීවි පද්ධතියක් අස්වැන්න නෙලීමෙන් හෝ වෙනත් යම් වෙනස්කමක් සිදු කිරීමෙන් හෝ අනතුරුව යළි එහි ස්වභාවික ව්‍යුහයට පත්වී ප්‍රාථමික හෝ පරිණත බවට පත්වීමට කොපමණ කාලයක් ගතවේද යන්න මත තීරණය කරනු ලබයි.

**ආවේනික විශේෂ**: යම් භූමි ප්‍රදේශයක ස්වභාවයෙන් හට ගන්නා විශේෂ එම ප්‍රදේශයට ආවේනික විශේෂයි.

**ස්වභාවික චක්‍රය:** පස ජලය ශාක සහ සත්ත්ව විශේෂ එකිනෙක හා ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඇතිවන පෝෂණ හෝ ඛණිජ චක්‍රයන්. මෙය යම් ප්‍රදේශයක ජීව විද්‍යාත්මක ඵලදායිතාව කෙරෙහි බලපායි.

**ස්වභාවික වන භූමිය:** FSC මගින් අනුමත වන කලමනාකාරිත්වයට අදාල ජාතික සහ කලාපීය තත්ත්ව මට්ටම් අනුව නිර්වචනය කරන ලද ආවේනික ජීවි පද්ධතිවල සංකීර්ණත්වය, ව්‍යුහය සහ විවිධත්වය යන මූලික ලක්ෂණ සහ අංග සහිත වන භූමිය.

**දැව නොවන වෙනත් වන ආශ්‍රිත නිෂ්පාදන:** දැව නොවන වෙනත් සියලු වන ආශ්‍රිත නිෂ්පාදන එනම් ඇට පත්‍ර වෙනත් පැල සහ සත්ත්ව නිෂ්පාදන

**වෙනත් වන භූමි විශේෂ**. වන වගාවකට හෝ ස්වභාවික වන භූමියක ලක්ෂණ සහිත නොවන වන භූමි ප්‍රදේශ. මෙය FSC මගින් අනුමත ජාතික හෝ කලාපීය තත්ත්වයන්ට අනුකූලව නිර්වචනය කර ඇත.

**වන වගාවන්:.** මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එනම් බීජ වැපිරීම හෝ ශාක රෝපණය හේතුවෙන් FSC මගින් අනුමත ජාතික හෝ කලාපීය තත්ත්වයන්ට අනුකූලව නිර්වචනය කර ඇති ආවේනික ජීවිපද්ධතිවල මූලික ලක්ෂණ හෝ ප්‍රධාන ගුණාංග රහිත වනභූමි ප්‍රදේශ.

**ප්‍රතිපත්ති**:. වන සත්කාරක ක්‍රියාවලියට අනුකූලවූ අත්‍යාවශ්‍ය නීතියක් හෝ අංගයක්

**යළි ස්ථාපිත කිරීම Restoration** : ජීව විද්‍යාත්මකව හෝ ඓතිහාසික වශයෙන් යම් ප්‍රදේශයකට වැදගත් වන ලක්ෂණයක් හඳුන්වාදීම යළි ස්ථාපිත කිරීම මගින් එම ජීවි පද්ධතිය නවීකරණයට ලක් කිරීම

**අන්තර් වර්ධන අවදිය Seral stage**: ජීවි පද්ධතියක වර්ධන ක්‍රියාදාමයකදී තාවකාලික ලෙස ඇතිවන ශාක පද්ධතියකි. මෙහිදී එක් විශේෂයෙක් අන් විශේෂ අභිබවා වර්ධනය වී ඇත.

**කෙටි ජීවන කාල චක්‍රයක් සහිත වන ශාක වර්ග** – සාමාන්‍යයෙන් දිගුකාලීන වශයෙන් වගා කරමින් අස්වැන්න ලබා ගැනීමට අපේක්ෂිත වර්ග මෙම වන පද්ධතිවල සාමාන්‍යයෙන් මෙවැනි වන ජීවි පද්ධතිවල සම්ප්‍රදායිකව දකින්නට ඇති ගති ලක්ෂණ දකින්නට නැත.
**ශාක රෝපණය Silviculture**: යම් භූමියක ශාක සංයුතිය හෝ වර්ධනය එහි හිමිකරුගේ අරමුණු අනුව වෙනස් කිරීම උදෙසා වෙනස් කිරීම. මෙහිදී රෝපනය කරන ශාක මගින් දැව ලබා ගැනීමක් සිදු නොවිය හැකි අවස්ථා ද වෙයි..

පාරම්පරික උරුමය: ස්වභාවික ක්‍රියාවලියක් හේතුවෙන් (මානව නොවන) කාලයත් සමග යම් ශාක හෝ සත්ව විශේෂයක හෝ වන ගහණයක සංයුතියේ ඇති ලක්ෂණ වැඩි දියුණුවෙමින් සිදුවන වෙනස
**භුක්තිය** : කිසියම් පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් යම් භූමි ඒකකයක් හෝ එහි ඇති සම්පත් (ගස්වැල් ශාක විශේෂ ජලය ඛණිජ සම්පත් ආදිය) අයිතිකර ගැනීම හිමිකාරීත්වය අත්පත් කර ගැනීම ප්‍රවේශය හා/හෝ භාවිතය පිළිබඳව සමාජීය වශයෙන් නිර්වචනය කර ඇති නීතියෙන් පිළිගත් හෝ සම්ප්‍රදායික වශයෙන් සිදු කරන අයිතිවාසිකම් හා යුතුකම් කොටසකි.

**තර්ජනයට ලක්ව ඇති විශේෂ**:නුදුරු අනාගතයේදී සම්පූර්ණයෙන්ම හෝ සැලකිය යුතු කොටසක් හෝ වඳවීමට ලක්විය හැකි විශේෂ

**භාවිතා කිරීමට ඇති අයිතිය**: ප්‍රාදේශිය චාරිත්‍ර ද්විපාර්ශවික එකගතාව හෝ ප්‍රවේශයට හිමිකම් ඇති අන් ආයතන මගින් විස්තර කර ඇති ආකාරය මත නිර්වචනය කරන ලද වනසම්පත් භාවිතයට ඇති අයිතිය. මෙම අයිතිය සම්පත් විශේෂයක් භාවිතා කිරීමට හෝ යම් මට්ටමකට භාවිතා කිරම හෝ අස්වැන්න නෙලීමේ යම් තාක්ෂණයක් භාවිතා කිරීමට

හෝ යනාදි වශයෙන් සීමාවිය හැකිය.